## ශිල්පීය ක්‍රම පිළිබඳ සටහන - II කොටස

### ප්‍රතිශෝධිත ජාතික ආදයම් ඇස්තමේන්තු

දේශීය හා ජාත්‍යන්තර ආර්ථික වෙනස්කම්වල බලපෑම නිසා ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ඇති වූ ව්‍යුහාත්මක වෙනස්කම් ඵලදායී ලෙස සළකා බැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1983 වසරේදී ජාතික ආදයම් ගිණුම් ගණනය කිරීම සවිස්තරාත්මකව ප්‍රතිශෝධනය කිරීමේ වැඩපිළිවෙලක් දියත් කරන ලදී. මෙම අභ්‍යාසයෙහි පළමු අදියරයෙහි ප්‍රතිඵලයන් සම්බන්ධ වන (i) කෘෂිකර්මය, (ii) කෘෂි සැකසුම්, (iii) ධීවර කටයුතු, (iv) පතල් හා කැණීම් කටයුතු, (v) විදුලි බලය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා, (vi) නිවාස අයිතිය හා (vii) රාජ්‍ය පරිපාලනය යන අංශ 1983 වාර්ෂික වාර්තාව සමග ප්‍රසිද්ධියට පත් කරන ලදී. දෙවන අදියරයේදී ප්‍රතිශෝධනයට භාජනය වූයේ පහත දැක්වෙන අංශ වේ :

(viii) ප්‍රවාහනය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුව.

(ix) තොග සහ සිල්ලර වෙළෙඳාම,

(x) අනෙකුත් සේවාවන්.

දෙවන අදියරයේදී ප්‍රතිශෝධනයට ලක් වූ අංශයනට අදාළ ප්‍රතිශෝධිත ජාතික ආදයම් ඇස්තමේන්තු හා පැරණි ජාතික ආදයම් ඇස්තමේන්තු අතර සැසඳීමක් 1අ. සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**1 අ. සංඛ්‍යා සටහන**

**එකතු කළ වටිනාකමෙහි ප්‍රතිශෝධිත (1982) ඇස්තමේන්තු හා පැරණි (1970) ඇස්තමේන්තු අතර සැසඳීම**

රු. දශ ලක්ෂ

| අංශය | පැරණි ඇස්තමේන්තු | නව ඇස්තමේන්තු | වෙනස්වීම |
|---|---|---|---|
| 8. ප්‍රවාහණය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුව .. | 8,536 | 10,666 | +2,130 |
| 9. තොග හා සිල්ලර වෙළෙඳාම .. | 16,059 | 19,694 | +3,635 |
| 9.1 ආනයන .. .. | 4,167 | 8,812 | +4,645 |
| 9.2 අපනයන .. .. | 2,861 | 2,018 | - 843 |
| 9.3 දේශීය .. .. | 9,031 | 8,864 | - 167 |
| 10. සේවා (අන් තැනෙක සඳහන් නොවන) .. | 8,698 | 4,604 | -4,094 |
| එකතුව | 33,293 | 34,964 | + 1671 |

මෙම සටහණෙහි පළමු කොටස 1983 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවෙහි පළ කර ඇත.

## කෘෂිකර්මය

### තේ

1984 වර්ෂයේදී කිලෝග්‍රෑම් 20 කෝටි 80 ලක්ෂයක් වශයෙන් ගණන් බලා ඇති තේ නිෂ්පාදනය ඉකුත් වසර හා සසඳා බලන කල වැඩි වශයෙන්ම යහපත් කාලගුණ තත්ත්වයන් නිසා, කිලෝග්‍රෑම් දෙකෝටි 87 ලක්ෂයක නැතහොත් සියයට 16 ක සැළකියයුතු වැඩිවීමක් පෙන්නුම් කළේය. නිෂ්පාදනයේ මෙම වැඩිවීම සියළුම නිෂ්පාදන ප්‍රදේශයන්හි දක්නට ලැබිණි. නිරපේක්ෂ වශයෙන් සලකා බලන කල ඉහළම වැඩිවීම (එක්කෝටි 15 ලක්ෂයක්) වාර්තා වූයේ උඩරට තේ වගා ප්‍රදේශ වලිනි.

පහත් හා මැදි බිම් ප්‍රදේශ වලින් පිළිවෙලින් කිලෝග්‍රෑම් එක්කෝටි 10 ලක්ෂයක් හා කිලෝ ග්‍රෑම් 62 ලක්ෂයක වැඩිවීම් වාර්තා විණි. පසුගිය වර්ෂය හා සසඳා බලන කල තාවකාලික දත්තයන්ට අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩල මගින් පාලනය වන වතුවල තේ නිෂ්පාදනය (මිලදී ගත් තේ දළු වලින් කෙරෙන නිෂ්පාදනය හැර) කිලෝග්‍රෑම් 99 ලක්ෂයකින් (සියයට 15.8 කින්) වැඩි වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා මගින් පාලනය වන වතුවල නිෂ්පාදනය කිලෝග්‍රෑම් 36 ලක්ෂයකින් (සියයට 6.7 කින්) වැඩිවිය. මෙම ආයතන දෙකෙහි නිෂ්පාදනයේ මුළු වැඩි වීමෙන් හතරෙන් තුන් කොටසකට ආසන්න ප්‍රමාණයකට දායකව ඇත්තේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ය. පසුගිය වර්ෂය හා සසඳාබලනකල 1984 දී පෞද්ගලික අංශයට අයත් තේ කම්හල්වල නිෂ්පාදනය කිලෝග්‍රෑම් ලක්ෂ 98 කින් නැතහොත් සියයට 25 කින් වැඩිවිය. එසේ වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩල හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවනට අයත් කම්හල්වල සකස් කරන ලද පෞද්ගලික අංශයේ නිෂ්පාදනය කළ අමු තේ දළු, පෞද්ගලික අංශය යටතේ ඇතුළත් කළහොත් මුළු නිෂ්පාදනයේ වැඩි වීමෙහි මෙම අංශයේ සාපේක්ෂ කොටස කිලෝග්‍රෑම් එක් කෝටි 47 ලක්ෂයක් නැතහොත් සියයට 51 ක් පමණ වේ.


තේ වගා අංශය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1983 ට වඩා මෙට්‍රික් ටොන් 21,700 කින් නැතහොත් සියයට 19 කින් වැඩිවිය. වැඩි වශයෙන්ම වර්ෂයේ මුල් භාගයට සීමා වූ මෙම වැඩිවීම යහපත් කාලගුණික තත්ත්වයන්ගේ සහ තේ මිළ උත්පාතයේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ලැබී ඇති දත්තයන්ට අනුව නිකුත් කළ පොහොර ප්‍රමාණයේ වැඩිවීමෙහි පෞද්ගලික අංශයේ කොටස රාජ්‍ය අංශයේ වතුවල කොටසට වඩා වැඩි බැව් දක්වේ.

1984 වර්ෂයේදී තේ වගාව යටතේ ලියාපදිංචිව ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,190 කින් අඩු විය. රාජ්‍ය අංශයේ බිම් ප්‍රමාණයෙහි වැඩිවීමක් දක්නට ලැබුණද, එය පෞද්ගලික අංශයේ බිම් ප්‍රමාණයේ පහත වැටීම සමහන් කිරීමට ප්‍රමාණවත් නොවීය. 1984 දී නැවත වගාකරන ලද බිම් ප්‍රමාණය පිළිබඳ සම්පූර්ණ දත්තයන් තවමත් ලැබී නොමැත. එසේ වුවද ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ගෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් ලැබී ඇති දත්තයන් අනුව, එම ආයතන මගින් පාලනය කරනු ලබන වතුවල නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය පසුගිය වර්ෂය හා සසඳා බලන කල පිළිවෙලින් සියයට 34 කින් (හෙක්ටයාර 149 කින්) හා සියයට 36 කින් (හෙක්ටයාර 177කින්) වැඩිවිය. නැවත වගාකිරීමේ මෙම වැඩිවීමට හේතුවී ඇත්තේ මෙම ආයතනයන්හි වැඩි දියුණු වූ මුදල් තත්ත්වය හා එක් වූ යහපත් කාලගුණික තත්ත්වයන්ය.

1984 ඔක්තෝබර් මාසයේ දී රබර් ඉඩම්වල තේ වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 11,740 සිට රුපියල් 25,000 දක්වා වැඩිකර ඇත. රාජ්‍ය අංශයේ වැවිලි කර්මාන්තයන්හි දිගු කාලීන ආයෝජනයන් රජයේ අනුග්‍රහය යටතේ ඇති ආයෝජන වැඩපිළිවෙලවල් මගින් නංවාලිය හැකි නිසා රාජ්‍ය අංශයේ වැවිලි සඳහා වූ සහනාධාර වැඩ පිළිවෙල 1984 නොවැම්බර් මාසයේදී අවලංගු කරන ලදී. එසේ වුවද, පෞද්ගලික අංශයේ ඉඩම් සඳහා වන සහනාධාර දිගටම පවත්වාගෙන යනු ලැබේ.

1984 වර්ෂයේදී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන වියදම රුපියල් 34 දක්වා සියයට 29 කින් වැඩිවී යැයි ගණන් බලා ඇත. ඉකුත් වර්ෂය හා සසඳා බලන කල ප්‍රධාන වශයෙන් ම 1984 අප්‍රේල් මාසයේදී වතු කම්කරුවනට දෙන ලද වැටුප් වැඩි කිරීම් නිසා, රාජ්‍ය අංශයේ වැවිලි කර්මාන්තයන්හි නිෂ්පාදන වියදමේ වැඩිවීම සියයට 24–29 අතර පරතරයක පැවතිණි. සාමාන්‍ය අපනයන (නැ.වි.ස) මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 52.52 සිට රුපියල් 77.20 දක්වා සියයට 47 කින් වැඩි විය. ඒ නිසා නිෂ්පාදන වියදම වැඩි වුවද සාමාන්‍ය නිෂ්පාදන ආන්තිකය සියයට 11 කින් පමණ වැඩිවී යැයි ගණන් බලා ඇත. එහෙත් මෙය ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුවල සියයට 19 ක පහත වැටීමේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුවල සියයට හයක් වැඩිවීම දක්වා වෙනස් වූ අතර, පෞද්ගලික අංශයේ ආන්තිකයන් රාජ්‍ය අංශයේ ආන්තිකයන්ට ඉහළින් පැවතිණි.

## ප්‍රධාන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.11 සංඛ්‍යා සටහන

### තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1982 – 1984

| ශීර්ෂය | ඒකකය | 1982 | 1983(අ) | 1984(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 187.8 | 179.3 | 208.0 |
| 1.1 උස් බිම් .. | ,, | 71.7 | 67.8 | 79.3 |
| 1.2 මැදි බිම් .. | ,, | 51.6 | 48.4 | 54.6 |
| 1.3 පහත් බිම් .. | ,, | 64.5 | 63.1 | 74.1 |
| 2. තේ වගාව යටතේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 242 | 230 | 228 |
| 3. පොහොර නිකුතුව .. | මෙ. ටොන් දහස් | 102.7 | 115.5 | 137.2 |
| 4. නැවත වගා කිරීම් .. | හෙක්ටයාර | 2,004 | 1,367 | ලැ.නො. |
| 5. මිල | | | | |
| 5.1 කොළඹ (ශුද්ධ) .. | කි. ග්‍රෑ./රුපියල් | 22.52 | 36.96 | 46.45 |
| 5.2 අපනයන (නැ.වි.ස) .. | ,, | 35.03 | 52.52 | 77.20 |
| 6. නිෂ්පාදන වියදම් .. | ,, | 22.68 | 26.37 | 34.00 |
| 7. අපනයන .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 181.0 | 157.8 | 204.0 |
| 8. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ) | 6,342 (276) | 8,295 (330) | 15,764 (604) |
| 9. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්(ඇ) | | 4.7 | 4.9 | 7.0 |

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලිකයි.
(ඇ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.
සැලකිය යුතුයි: හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව පිළිබඳ දත්ත ලැබී නැත.

ඉහළ මිළ ගණන් හා එක් වූ වැඩි නිෂ්පාදනය නිසා, පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ ද ද්‍රවශීලතා තත්ත්වයෙහි සැළකිය යුතු දියුණුවක් ඇති විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලවලට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවලට බැංකු ක්‍රමය කෙරෙහි වූ සිය වගකීම් සෑහෙන ප්‍රමාණයකින් අඩු කරගැනීමට හැකි වූ අතර, ඒ සමග වූ සිය තැන්පතු වැඩි කරගැනීමට ද හැකි විය. එමෙන්ම වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වය නිසා සිය ප්‍රාග්ධන වියදම් වැඩ පිළිවෙල නියමිත පරිදි කරගෙන යෑමට ඉඩ සැළසුණි. කුඩා ඉඩම් හිමියන් ඇතුළු පෞද්ගලික අංශයේ නිෂ්පාදකයින් විසින් ද තේ ඉඩම්වල සිය කෙටිකාලීන ආයෝජනයන් වැඩි කරන ලදී.

මිළ ගණන් වැඩිවන විට, වැටුප් වැඩි කිරීම සඳහා රාජ්‍ය අංශයේ වතු කළමනාකරුවන් කෙරෙහි ඇතිවන බලපෑම ද වැඩිවේ. කෙසේ වුව ද, මිළ උත්පාතය තාවකාලික කරුණක් වන හෙයින් දිගු කාලයක් තුළ සතුටුදායක වැටුප් මට්ටමක් පවත්වාගන යාම සඳහා පාලකයිනට ඉඩ සැළසෙන පරිදි ශ්‍රම ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා වැඩි අවධාරණයක් දැක්විය යුතුව ඇත.

කුඩා ඉඩම් හිමියනට ද ඉහළ මිළ ගණන් මගින් වාසි සැලසී ඇත. 1984 දී කුඩා තේවතු සංවර්ධන අධිකාරිය විසින් පාලනය කරනු ලබන කම්හල්වලින් අමු තේ දළු සඳහා ගෙවන ලද මිළ ගණන් සාමාන්‍යයෙන් සියයට 20 කින් පමණ වැඩි විය. කුඩා තේවතු සංවර්ධන අධිකාරිය විසින් හිනිදුම ඡන්ද කොට්ඨාශයේ තවත් අළුත් තේ කම්හල් තුනක් විවෘත කරන ලද අතර පිළිවෙලින් මහනුවර හා බදුල්ල දිස්ත්‍රික්කයන්හි තේ කම්හල් දෙකක් පවරා ගන්නා ලදී. මෙසේ වර්ෂය අවසාන වනවිට කුඩා තේවතු සංවර්ධන අධිකාරිය විසින් දිවයිනෙහි තේ කම්හල් 14 ක් පවත්වාගෙන ගිය අතර, ඉන් වැඩි කොටසක්ම පිහිටා තිබුනේ පහත් බිම් ප්‍රදේශවලය. කෙසේ වුවද ව්‍යාපෘති කටයුතු, පොහොර බෙදා හැරීම, අලෙවිය සහ කුඩා ඉඩම් හිමියන් නිෂ්පාදන සංගම් ලෙසින් සංවිධානය කිරීම වැනි කටයුතු කෙරෙහි වැඩි අවධානයක් දැක්වීමෙන් කුඩා තේවතු සංවර්ධන අධිකාරියට මෙයට වඩා සේවයක් කළ හැකි වනු ඇත.

වර්ෂය තුළදී තේ අපනයන බදු ක්‍රමයේ වෙනස්කම් කිහිපයක් ඇති කරන ලදී. තේවල වටිනාකම අනුව අයකරන බද්දෙහි මෙතෙක් පැවති ඒකීය අනුපාතික ක්‍රමය වෙනුවට, 1984 ජනවාරි මස සිට ද්විත්ව ප්‍රතික්‍රමික බදු අනුපාතික ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ බදු අනුපාතිකය, කිලෝග්‍රෑමයකට රුපියල් 28 ක දළ වෙන්දේසි මිළට වැඩි බදු අයවිය යුතු පළමු රුපියල් 27 කොටස දක්වා සියයට 50 ක් ද තේ වෙන්දේසි මිළ රුපියල් 55 ට වැඩිවන විට එසේ වැඩි වූ ප්‍රමාණය සඳහා සියයට 40 ක් ද වේ. මෙම ප්‍රතිශෝධනයන් ඇති කරන ලද්දේ මිළ උත්පාතයෙන් නිෂ්පාදකයිනට ලැබෙන අමතර ලාභයෙන් කොටසක් වෙන්කර තැබීම උදෙසාය. 1984 නොවැම්බර් මාසයේ දී බද්දෙහි පදනම් මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 28 සිට රුපියල් 32 දක්වා වැඩි කරන ලද අතර, වෙන්දේසි මිළ මෙම මිළට වැඩි වන විට එම අතිරික්තය සියයට 50 ක බද්දකට යටත් කරමින් නැවතත් ඒකීය බදු අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී.

තේ මළුවලට හැර අනෙකුත් සියළුම තේ වර්ග සඳහා වූ විශේෂිත තේ අපනයන බදු, 1984 නොවැම්බර් මාසයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 2 කින් අඩු කරන ලද අතර, තේ මළු සඳහා බද්ද අඩු කරන ලද්දේ කිලෝග්‍රෑමයකට ශත 50 කිනි. පෞද්ගලික අංශයේ තේ ඉඩම් සඳහා වූ සහනාධාර වැඩ පිළිවෙලවල්වලට අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා වැඩියෙන් අරමුදල් සැලසීමේ අරමුණ ඇතිව, තේ කර්මාන්තය සඳහා වූ සංවර්ධන සෙස් බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 1.25 සිට රුපියල් 1.50 දක්වා සත 25 කින් වැඩි කරන ලදී.

මෙම වර්ෂය තුළදී තේ අපනයන බදු ප්‍රතිදාන යෝජනා ක්‍රමය ද සංශෝධනය කරන ලදී. 1984 ජනවාරි මාසයේදී වැඩි වටිනාකමක් එකතු කරන ලද ස්වරූපයෙන් අපනයනය කරනු ලබන තේ සඳහා වැඩි සානුබලයක් සැපයීමේ අරමුණ ඇතිව, ඇසුරුම්වල බහාලූ තේ සහ තේ මළු සඳහා වූ අපනයන බදු ප්‍රතිදානය සියයට දශම 5 කින් වැඩිකරන ලදී.

වර්ෂය තුළදී රජය සතු තේ වැවිලි අංශයෙහි ශක්‍යතාව වැඩිකිරීමේ රජයේ ප්‍රයත්නය තව දුරටත් ශක්තිමත්ව ක්‍රියාත්මක විය. තේ පුනරුත්ථාපන යෝජනා ක්‍රම 1, ඒකාබද්ධ තේ සංවර්ධන යෝජනා ක්‍රමය සහ තේ පුනරුත්ථාපන සහ විවිධාංගීකරණ යෝජනා ක්‍රමය යන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරගෙන යාමට අමතරව මෙම අංශයේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින යෝජනා ක්‍රම යටතට නොඑන රාජ්‍ය අංශයේ තේ වතු සඳහා මැදි හා දිගු කාලීන ආයෝජන වැඩ පිළිවෙලක් සකස් කිරීමේ කටයුතු ද අවසන් කරන ලදී. මෙම පස් අවුරුදු වැඩ පිළිවෙලට (1985-1989) අවශ්‍ය අරමුදල් වලින් කොටසක් ලෝක බැංකුව විසින් සපයනු ලැබේ. මෙම යෝජනා ක්‍රමයෙන් හෙක්ටයාර 7,000 ක මුළු ඉඩම් ප්‍රමාණයක් අළුතින් හා නැවත වගා කිරීමට ද, පාළු පිරවීම සැළකිය යුතු පරිදි වේගවත් කිරීමට ද අදහස් කෙරේ. එමෙන්ම එමගින් පස සංරක්ෂණය, කම්හල් නවීකරණය සහ වතු කම්කරුවන්ගේ සෞඛ්‍යය හා සුභසාධක සේවාවන් වැඩි දියුණු කිරීමට ද ඉඩ සලසා ඇත.

තේ මිළ ගණන්වල අවිනිශ්චිත බව හා එමගින් කර්මාන්තයේ කෙටි කාලීන මෙන්ම දීර්ඝකාලීන ආයෝජනයන් සඳහා ඇතිවිය හැකි අහිතකර බලපෑම සැළකිල්ලට ගනිමින් තේ වගා අංශය වෙනුවෙන් ස්ථායීකරණ අරමුදලක් පිහිටුවීම සඳහා රජය විසින් යෝජනා කරන ලදී. ඒ අනුව වෙන්දේසි මිළ දීර්ඝකාලීන සාමාන්‍ය මිළට වැඩිවන විට මහා භාණ්ඩාගාරය විසින් කලින් නිශ්චය කරන ලද මුදල් ප්‍රමාණයක් අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. නිෂ්පාදකයින්ට ඔවුන්ගේ ආයෝජනයට ප්‍රමාණවත් වන සාධාරණ ලාභයක් නොලැබෙන අන්දමේ මට්ටමකට වෙන්දේසි මිළ පහත වැටෙනවිට, අරමුදල විසින් නිෂ්පාදකයිනට ප්‍රතිදානයන් සලසනු ඇත. මෙම යෝජිත අරමුදල 1985 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**රබර්**

1984 වර්ෂයේදී කිලෝග්‍රෑම් 14 කෝටි 20 ලක්ෂයක් වශයෙන් තාවකාලිකව ගණන් බලා ඇති රබර් නිෂ්පාදනය, ඉකුත් වර්ෂය හා සසඳා බලන කල කිලෝග්‍රෑම් 20 ලක්ෂයක නැතහොත් සියයට එකක පමණ සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම සම්පූර්ණ වැඩිවීමම දක්නට ලැබුනේ ජනතා වතු සංවර්ධන මණ්ඩල හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා මගින් පාලනය වන වතුවලය. පසුගිය වර්ෂයේ දක්නට ලැබුණු සතුටුදායක ක්‍රියාකාරිත්වයට හාත්පසින් වෙනස්ව පෞද්ගලික අංශයේ නිෂ්පාදනය සියයට තුනකින් (කිලෝග්‍රෑම් 25 ලක්ෂයකින්) පහත වැටුණි. පෞද්ගලික අංශයේ නිෂ්පාදනයේ මෙම පහත වැටීම එක්තරා දුරකට වර්ෂය තුළදී කිරි කපන ලද බිම් ප්‍රමාණයේ අඩුවීම නිසා සිදු වූ අතර, රජයට අයත් වතුවල නිෂ්පාදනයේ වැඩිවීම කිරි කපන ලද බිම් ප්‍රමාණය ඉහළයාම සහ හෙක්ටයාරයක සාමාන්‍ය පලදාවේ වැඩිවීම යන කරුණුවල ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

පසුගිය වර්ෂය හා සැසඳීමේ දී 1984 වර්ෂය තුළදී ගස් උදුරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 6,070 දක්වා සියයට හයකින් වැඩිවූ අතර, කිරි කපනු ලබන මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,514 කින් නැතහොත් සියයට එකකින් අඩුවිය. කෙසේ වුව ද, හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව 1983 දී කිලෝග්‍රෑම් 821 සිට 1984 දී කිලෝග්‍රෑම් 840 දක්වා සියයට දෙකකින් වැඩිවිය. එමගින් වර්ෂය තුළදී කිරි කපනු ලබන බිම් ප්‍රමාණයේ වූ අඩුවීම නිසා, මුළු නිෂ්පාදනය කෙරෙහිවූ අහිතකර බලපෑම මුළුමනින්ම සමහන් විය. 1982 සිට සාමාන්‍ය පලදාවේ වැඩිවීමේ උපනතියක් දක්නට ලැබුන ද එය ඉතා මෑත වර්ෂයක් වන 1978 දී වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 845 ඉහළම නිෂ්පාදනයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතී.

රබර් වගා අංශය සඳහා පොහොර නිකුත් කිරීම සම්බන්ධයෙන් 1982 වර්ෂයේ සිට දක්නට ලැබුණු වැඩිවීමේ උපනතිය දිගටම පැවතිණි. 1984 වර්ෂය තුළදී මෙම අංශයට නිකුත් කළ මුළු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 23,500 ක්වූ අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 26 ක (මෙට්‍රික් ටොන් 4,900) වැඩිවීමකි. සංඛ්‍යා දත්තයන් අනුව, පෞද්ගලික අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණයේ සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. එසේ වුවද, පසුගිය කාලවල මෙන් පෞද්ගලික අංශයේ පොහොර භාවිතය වැඩි වශයෙන්ම නොමේරූ රබර් ඉඩම්වලට සීමාවී පැවතිණි. මේරූ රබර් ඉඩම්වලට පොහොර යෙදීම සඳහා පෞද්ගලික අංශයේ වගාකරුවන් දිරි නොගැන්වුවහොත්, ඔවුන්ගේ ඉඩම්වල ඵලදායිතාවයේ සැළකිය යුතු වැඩි දියුණුවීමක් ලබා ගැනීම බෙහෙවින් අපහසු වනු ඇත.

තාවකාලික දත්තයනට අනුව වර්ෂය තුළදී නැවත වගාකරනලද මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 5,530 දක්වා සියයට 14 කින් වැඩි විය. මෙය ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික අංශයේ ඉඩම්වල දක්නට ලැබූ නැවත වගා කිරීමේ කැපී පෙනෙන වැඩිවීම නිසා සිදුවූවකි. රබර් පුනරුත්ථාපන වැඩපිළිවෙල යටතේ කෑගල්ල, කළුතර, සහ රත්නපුර යන ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්ක තුනෙහි නැවත වගාකිරීමේ වැඩකටයුතු වඩා හොඳින් කරගෙනයාම පෞද්ගලික අංශයේ මෙම වැඩි දියුණු වීමට හේතු වී ඇත. මෙයට හාත්පසින්ම වෙනස්ව රාජ්‍ය අංශයේ වතුවල නැවත වගා කරන ලද බිම් ප්‍රමාණයේ එකතුව සියයට හයකින් අඩුවිය.

1983 වර්ෂය හා සසඳා බලන කල, 1984 දී අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 482 කින් නැතහොත් සියයට 28 කින් පහත වැටීමෙන් දැඩි පසුබෑසීමකට ලක්විය. ඉතා ඉහළ මට්ටමක පැවති තේ මිළ ගණන් මෙම පහත වැටීම කෙරෙහි බල පා ඇති බැව් පෙනේ. ඇත්ත වශයෙන්ම තේ වගා කිරීමේ අරමුණ ඇතිව සමහර ප්‍රදේශවල ඉඩම් වලින් රබර් ගස් උදුරා ඇති බැව් වාර්තා වී ඇත. නැවත වගා කිරීම හා අළුතින් වගා කිරීම සඳහා වූ සහනාධාරයන් වර්ෂය තුළදී නොවෙනස්ව පැවතිණි. කෙසේ වුව ද, ආර්ථික නොවන රබර් ඉඩම්වල තේ වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 11,740 සිට හෙක්ටයාරයකට රුපියල් 25,000 දක්වා 1984 ඔක්තෝබර් මස සිට වැඩි කරනු ලැබීය.

### 1 . 12 සංඛ්‍යා සටහන

### රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1982—1984

| ශීර්ෂය | ඒකකය | 1982 | 1983 (අ) | 1984(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කි. ග්‍රෑ. දශ ලක්ෂ | 125 | 140 | 142 |
| 2. බිම් ප්‍රමාණය | | | | |
| 2.1 වගාව යටතේ ඇති .. | හෙක්ටයාර දහස් | 205·7 | 205·6 | 205·6 |
| 2.2 කිරි කැපිම යටතේ ඇති .. | ,, | 170·7 | 170·5 | 168·9 |
| 3. පලදාව .. | හෙක්ටයාරයට/ කි. ග්‍රෑ. | 729 | 818 | 840 |
| 4. පොහොර නිකුතුව .. | මෙ. ටොන්දහස් | 16·5 | 18·6 | 23·5 |
| 5. නැවත වගා කිරීම .. | හෙක්ටයාර | 5,866 | 4,862 | 5,530 |
| 6. මිළ .. | | | | |
| 6.1 අපනයන (නැ.වී.ස ) .. | කි. ග්‍රෑ./රුපියල් | 17·68 | 22·77 | 26·16 |
| 6.2 කොළඹ ආර්. ඇස්. ඇස්. නො. 1 .. | ,, | 10·18 | 13·95 | 14·40 |
| 7. නිෂ්පාදන වියදම (ඇ) .. | ,, | 9·66 | 9·90 | 11·23 |
| 8. අපනයන .. | කි. ග්‍රෑ. දශ ලක්ෂ | 131·3 | 125·2 | 126·2 |
| 9. දේශීය පරිභෝජනය .. | ,, | 16·4 | 16·4 | 15·1 |
| 10. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ) | 2,323 (101) | 2,852 (114) | 3,301 (127) |
| 11. එකතු කළ වටිනාකම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඈ) .. | | 2·1 | 2·1 | 2·2 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලිකයි.
(ඇ) රාජ්‍ය අංශයේ වතුවල, පෞද්ගලික අංශයේ වතුවල සහ කුඩා වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.
(ඈ) වගා කිරීම සහ සැකසුම් කටයුතු වල පමණක්.

මූලයන්: රබර් පාලන දෙපාර්තමේන්තුව; ජාතික පොහොර ලේකම් කාර්යාලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ වගාකරුවනට ද නිෂ්පාදන වියදම් ඉහළයාමේ අත්දැකීමකට මුහුණ පෑමට සිදුවිය. කෙසේ වුවද, රාජ්‍ය අංශයේ වතු සම්බන්ධයෙන් එම ඉහළයාමේ අනුපාතිකය පෞද්ගලික අංශයට වඩා වැඩි විය. මෙයට හේතු වූයේ 1984 අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි වතුවල වැටුප් වැඩි කිරීමත්, ගැහැණු හා පිරිමි කම්කරුවන්ගේ වැටුප් සමාන තත්ත්වයට ගෙන ඒමත්ය. වැඩ කරන දින ගණන සහතික කිරීමේ ක්‍රමයක් ආරම්භ කිරීම ද නිෂ්පාදන වියදමේ වැඩිවීමට හේතු වී ඇත. පෞද්ගලික අංශයේ වතු වලට සහ කුඩා ඉඩම් හිමියනට නිෂ්පාදන වියදම් වැඩිවීම සාධාරණ සීමාවන් තුළ රඳවාගත හැකි වූයේ ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ වතුවල වැටුප් අනුපාතිකයට වඩා පෞද්ගලික අංශයේ වැටුප් අනුපාතිකය පහත් මට්ටමක තබා ගැනීමෙණි.

රබර්වල (සියළුම වර්ග) සාමාන්‍ය අපනයන (නැ.වී.ස.) මිළ 1984 දී සියයට 15 කින් වැඩි වූ අතර, ආර්.එස්.එස්. නොම්මර 1 හි කොළඹ වෙන්දේසි මිළ සියයට තුනකින් වැඩි විය. කෙසේ වුවද, වර්ෂය තුළදී ඉහළ නගිමින් පැවති නිෂ්පාදන වියදම මගින් නිෂ්පාදන ආන්තිකයන්ට ඇතිවූ අවාසිදායක බලපෑම සමහන් කිරීමට මිළෙහි මෙම වැඩිවීම ප්‍රමාණවත් නොවීය.

ලාභාන්තිකයන් පහත වැටෙමින් පැවති හෙයින්, වටිනාකම අනුව වෙනස්වන නව අපනයන බදු පරිමාණයක් හඳුන්වා දීමත් සමගම, 1984 ජුලි මාසයේදී රබර් සඳහා වූ අපනයන බද්ද රජය විසින් කිලෝග්‍රෑමයකට රුපියල් දෙකකින් අඩු කරන ලදී. නැවත 1984 නොවැම්බර් මාසයේදී ලාභාන්තිකයන් වැඩිකිරීමේ අදහසින්, රජය විසින් බදු අනුපාතිකයන් සංශෝධනය කරනු ලැබූ අතර, වටිනාකම අනුව වෙනස්වන අපනයන බදු පරිමාණ ක්‍රමයේ පදනම් මිළ ආර්.එස්.එස්. නොම්මර 1 සිට ආර්.එස්.එස් නොම්මර 2 දක්වා වෙනස් කරන ලදී. මෙමගින් වගාකරුවනට ලැබෙන මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 2.25 කින් පමණ වැඩිවේයැයි අපේක්ෂා කෙරිණි. වගාකරුවනට ලැබෙන ආන්තිකයන් එපරිද්දෙන්ම වැඩි නොවූයේ වෙළෙඳපොල අපූර්ණතාවන් සහ අනෙකුත් හේතූන් නිසා වන්නට ඇත.

රබර් වගාව සහ සැකසුම් කිරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ ඇති වැඩි වැදගත්කම සලකා බලන කල, රබර් කර්මාන්තයේ දිගු කාලීන දියුණුව වැඩි වශයෙන්ම පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය මත රඳා පවතින නමුත්, එම අංශයට දැනට ප්‍රශ්න රාශියකට මුහුණ පෑමට සිදුව ඇත. කුඩා ඉඩම් හිමියන්ගෙන් වැඩි කොටසක් වැරදි කිරි කැපීමේ ක්‍රම සහ නුසුදුසු නඩත්තු පිළිවෙත් දිගටම අනුගමනය කරන බව පෙනෙන්නට ඇත. නැවත වගාකිරීමේ අසම සහ උච්චාවචනය වන ක්‍රියාකාරිත්වය පෞද්ගලික අංශයේ දක්නට ලැබෙන ප්‍රධාන දුර්වලතාවයකි. එනිසා මෙම අංශයේ නැවත වගා කිරීමේ කටයුතු අඛණ්ඩව හා ක්‍රමානුකූලව කරගෙනයාම සහතික කරනු පිණිස අවශ්‍ය ප්‍රතිශෝධනයන් ඇතිකිරීමේ අරමුණ ඇතිව සහනාධාර ක්‍රම නිතර විමසිල්ලට භාජනය කළ යුතුය. එමෙන්ම පෞද්ගලික අංශයේ සකස්කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වහා පියවර ගැනීම අවශ්‍යව ඇත්තේ රබර්වල තත්ත්වය කෙරේ අහිතකර අන්දමින් බලපාන රබර් සකස් කිරීමේ ක්‍රම දිගටම අනුගමනය කරන කුඩා ඉඩම් හිමියන්ගෙන් වැඩි කොටසක් මෙම අංශයට අයත්වන හෙයිනි. මේ සම්බන්ධයෙන් රබර් සමූහ සැකසුම් මධ්‍යස්ථාන ක්‍රමයේ වඩා ක්‍රමානුකූල ප්‍රසාරණයක් සඳහා ප්‍රතිපත්තිමය අවධානය යොමුවිය යුතුය. වගාකිරීම, සැකසීම හා අලෙවිය සම්බන්ධ ආධාර ඒකාබද්ධ කරමින් මෙම යෝජනා ක්‍රමය යළි සැළසුම් කළ යුතුව ඇත.

රබර් කර්මාන්තය පුනරුත්ථාපනය කිරීම සඳහා රාජ්‍ය අංශයේ වතු වලින් ද ප්‍රධාන මෙහෙයක් ඉටුවිය යුතුය. මෙම වතුවලින්, පෞද්ගලික අංශයේ ඉඩම් වලට වඩා සැළකිය යුතු අන්දමේ ඉහළ සාමාන්‍ය පලදාවක් වාර්තා වුව ද, ඒවායේ ලැබී ඇති ඵලදාව ලබා ගත හැකි මට්ටමට වඩා බෙහෙවින් අඩුව පවතී. මින් මෙම අංශයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ ඇති වැදගත්කම දක්වේ. මැදිකාලීන ආයෝජන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමෙන් පසු රාජ්‍ය අංශයේ රබර් ඉඩම්වල ඵලදායිතාවේ සැහෙන දියුණුවක් ඇතිවේයැයි අපේක්ෂා කෙරේ.

1983 දී දේශීය රබර් පාරිභෝජනය කිලෝග්‍රෑම් එක්කෝටි 64 ලක්ෂයේ සිට 1984 දී කිලෝග්‍රෑම් එක්කෝටි 51 ලක්ෂය දක්වා සියයට අටකින් අඩු විය. ප්‍රධාන රබර් පාරිභෝජකයකු වන ශ්‍රී ලංකා ටයර් සංස්ථාවේ සාපේක්ෂ වශයෙන් වූ දුර්වල ක්‍රියාකාරිත්වය මේ සඳහා එක්තරා දුරකට හේතුවිය. පසුගිය වසර කිහිපය තුළදී දිවයිනේ රබර් මත පදනම් වූ කර්මාන්තවල ප්‍රමාණවත් වර්ධනයක් දක්නට නොලැබිණි.

**පොල්**

1984 වර්ෂයේදී පොල් නිෂ්පාදනය ගෙඩි 198 කෝටි 20 ලක්ෂයක ඉතා පහළ මට්ටමකට වැටුණි. මෙය 1977 වර්ෂයෙන් පසු වාර්තාගත අඩුම නිෂ්පාදන මට්ටම විය. පසුගිය වර්ෂය හා සසඳන කල 1984 වර්ෂයේ නිෂ්පාදනයේ පහත වැටීම ගෙඩි 33 කෝටි 10 ලක්ෂයක් හෙවත් සියයට 14 ක් විය. එසේම පසුගිය වසරේ සම කාලපරිච්ඡේද හා සසඳන කල වර්ෂයේ මුල් භාගයේ නිෂ්පාදනය සියයට 20 කින් ද, දෙවන භාගයේ නිෂ්පාදනය සියයට නවයකින්ද පහත වැටී ඇත. නිෂ්පාදනයෙහි මෙම පහත වැටීමෙන් පිළිබිඹුවන්නේ 1983 වර්ෂයේ වැඩි කාලයක් මුළුල්ලේ පැවති නියඟයෙහි පසුකාලීන බලපෑමයි.

වර්ෂය තුළදී පොල් තෙල් සහ කපාපු පොල් නිෂ්පාදනය 1983 වර්ෂය හා සසඳා බලන කල පිළිවෙළින් සියයට 53 කින් සහ සියයට 25 කින් තියුණු ලෙස පහත වැටුණි. මෙය එක්තරා දුරකට පොල් ගෙඩි නිෂ්පාදනය අඩුවීම සහ ගෘහ පාරිභෝජනය සඳහා ගැනීම නිසා සැකසුම් කර්මාන්තයට ලබාගත හැකි වූ පොල් ගෙඩි ප්‍රමාණය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය.

මෙතෙක් පැවති වැඩිවීමේ උපනතිය තවදුරටත් තහවුරු කරමින් පොල් වගා අංශයට නිකුත් කරනු ලැබූ පොහොර ප්‍රමාණය 1984 දී සියයට 40 කින් වැඩි විය. පසුගිය වර්ෂයේදී මෙම වැඩිවීම සියයට 18 ක් පමණක් විය. මෙම වැඩිවීම 1983 අවසාන කාර්තුවෙන් පටන්ගෙන

1984 වසර මුළුල්ලේම පැවති යහපත් කාලගුණික තත්ත්වයන් සහ වර්ෂය තුළදී දේශීය වෙළෙඳපොලේ පොල් ගෙඩි මිළ සැළකිය යුතු ලෙස ඉහළ යාම යන හේතූන් දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

**1·13 සංඛ්‍යා සටහන**

**පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1982 – 1984**

| ශීර්ෂය | ඒකකය | 1982 | 1983 | 1984(අ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය(ආ) | ගෙඩි දශ ලක්ෂ | 2,521 | 2,313 | 1,982 |
| 1·1 කපාපු පොල් | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 286 | 295 | 221 |
| 1·2 පොල් තෙල් | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 820 | 663 | 289 |
| 1·3 කොප්පරා(ඇ) | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 19 | 18 | 12 |
| 1·4 ගෙඩි පොල් අපනයන | ගෙඩි දශ ලක්ෂ | 9 | 6 | 4 |
| 1·5 දේශීය පොල් ගෙඩි පරිභෝජනය(ඉ) | ගෙඩි දශ ලක්ෂ | 1,367 | 1,373 | 1,441 |
| 2. සාමාන්‍ය මිළ | | | | |
| 2·1 කොළඹ | ගෙඩිය රුපියල් | 1·60 | 2·42 | 4·07 |
| 2·2 අපනයන (නැ.වී.ස.) | ගෙඩිය රුපියල් | 3·32 | 3·66 | 6·48 |
| 3. පොහොර නිකුතුව | මෙ. ටො. දහස් | 30·2 | 35·7 | 50·0 |
| 4. නිෂ්පාදන වියදම | ගෙඩිය රුපියල් | 0·57 | 0·60 | 0·63 |
| 5. නැවත වගාව/යටි වගාව(ඊ) | හෙක්ටයාර | 3,543 | 2,641 | 2,553 |
| 6. නව වගාව(ඊ) | හෙක්ටයාර | 5,291 | 3,394 | 1,580 |
| 7. අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 1,497 | 1,921 | 2,118 |
| | (ඩීගැහි දශ ලක්ෂ) | (65) | (76) | (81) |
| 7·1 මද නිෂ්පාදනයන් | රුපියල් දශ ලක්ෂ | 1,003 | 1,409 | 1,553 |
| | (ඩීගැහි දශ ලක්ෂ) | (44) | (56) | (59) |
| 7·2 අනෙකුත් නිෂ්පාදනයන් | රුපියල් දශ ලක්ෂ | 494 | 512 | 565 |
| | (ඩීගැහි දශ ලක්ෂ) | (21) | (20) | (22) |
| 8. එකතු කළ වටිනාකම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්(උ) | | 4·1 | 3·8 | 4·4 |

මූලයන්: පොල් සංවර්ධන අධිකාරිය;
පොල් වගා කිරීමේ මණ්ඩලය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම් සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)

(ඇ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදා ගත් අනුපාතිකයන්; කපාපු පොල් මෙ. ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ. ටො. 1 = ගෙඩි 8,000
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925

(ඈ) අපනයන පමණි.

(ඉ) ඒක පුද්ගල ගෘහ පරිභෝජනය 1982, 1983 වර්ෂ සඳහා වසරකට ගෙඩි 90 වශයෙන්ද, 1984 වර්ෂය සඳහා ගෙඩි 92·4 වශයෙන්ද ගණන් බලා ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.

(ඊ) විස්තරාත්මක තොරතුරු ලබා ගත නොහැකි බැවින් හෙක්ටයාර 0.4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.

(උ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

1984 වර්ෂය තුළදී රජයට අයත් ප්‍රධාන බැංකු දෙක වන ලංකා බැංකුව සහ මහජන බැංකුව මගින් පවත්වාගෙන යනු ලබන පොල් පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ දෙනු ලැබූ ණය සංඛ්‍යාව සහ මුදාහරින ලද ණය මුදල් ප්‍රමාණයෙහි විශාල වර්ධනයක් වාර්තා කෙරුණි. දෙනු ලැබූ ණය සංඛ්‍යාව 1984 දී 1,614 දක්වා තෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි විය. දෙනු ලැබූ ණය ප්‍රමාණය ද, 1983 දී රුපියල් 52 ලක්ෂයක සිට 1984 දී රුපියල් එක්කෝටි 35 ලක්ෂය

22501
21 APR 2009

දක්වා වැඩි විය. පොල් පොහොර ණය ප්‍රමාණයේ මෙම කැපීපෙනෙන වැඩිවීමට එක් හේතුවක් වූයේ කලින් පැවති නොකඩවා වර්ෂ දෙකක් දක්වා වූ උපරිමය වෙනුවට වගාකරුවන්ට නොකඩවා වර්ෂ තුනක් දක්වාම, ණය ලබා ගත හැකි වන අයුරින් 1984 මැද භාගයේදී පමණ මෙම ණය ක්‍රමය ප්‍රතිශෝධනය කිරීමයි.

මෑත කාලයේදී පොල් පුනරුත්ථාපනය, නැවත වගා කිරීම, යටි වගාව සහ අළුතින් වගා කිරීම ආදිය සම්බන්ධයෙන් පැවති දුර්වල ක්‍රියාකාරිත්වය 1984 වර්ෂය තුළදී ද දිගටම පැවතිණි. පුනරුත්ථාපනය කරනු ලැබූ පොල් ඉඩම් ප්‍රමාණය 1983 දී හෙක්ටයාර 5,539 සිට 1984 දී හෙක්ටයාර 5,092 දක්වා සියයට අටකින් පහත වැටුණි. නැවත වගා කළ සහ යටි වගා කළ බිම් ප්‍රමාණය ද වර්ෂය තුළදී සියයට තුනකින් අඩු විය. 1983 වර්ෂයේදී සියයට 36 කින් පහත වැටුණු අළුතින් වගා කළ බිම් ප්‍රමාණය 1984 දී වඩා තියුණු ලෙස සියයට 53 කින් පහත වැටුණි. පොල් වගා අංශයේ ප්‍රධාන සංවර්ධන වැඩකටයුතුවල මෙම පහත වැටීමේ උපනතිය අඩුකරලීමේ බලාපොරොත්තුවෙන් පුනරුත්ථාපනය, නැවත වගාව, යටි වගාව සහ අළුතින් වගා කිරීම සඳහා වන සහනාධාර ප්‍රමාණයන් 1984 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි සැළකිය යුතු ලෙස වැඩි කරන ලදී. කෙසේ වුවද, සංශෝධනය කළ සහනාධාර ප්‍රමාණයන්ගේ වාසි සමනය වන පරිදි, මෙම කටයුතු සඳහා කළ යුතු වියදම් වැඩි නොවුවහොත් මෙම ප්‍රතිශෝධිත ප්‍රමාණයන්ගෙන් පසුකාලීනව වුවද වාසිදායක ප්‍රතිඵල ලැබෙනු ඇත.

රජයේ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ පොල් ඉඩම්වල අතුරු භෝග වගාව, වර්ෂය තුළදී මිශ්‍ර ප්‍රතිඵල පෙන්වීය. අතුරු භෝග ලෙස කෝපි සහ කොකෝවා වගා කළ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 50 කින් පහත වැටුණ නමුත්, ගම්මිරිස් වගාකළ බිම් ප්‍රමාණය සියයට 21 කින් වැඩි විය. මේ අනුව වගා කරුවන්, වඩා කෙටි පල දැරීමේ කාලච්ඡේදයක් සහ සාපේක්ෂ වශයෙන් වඩා ඉහළ ලාභදායිතාවයක් ඇති භෝග වගා කිරීමට වැඩි කැමැත්තක් දක්වන බව පෙනී යයි. පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේ පෙන්වා දුන් පරිදි අතුරු භෝග වගාව, වගාකරුවන්හට අතිරේක ආදායමක් ලබා දෙන අතර සේවා නියුක්ති අවස්ථාවන් ද පුළුල් කිරීමෙන් ජාතික ආර්ථිකයට ද විශාල වාසි ගෙනදෙන බැවින් මෙම පුරුද්ද වැඩිදියුණු කිරීමට දැඩි ප්‍රයත්නයක් දැරීම අත්‍යාවශ්‍යය. එසේ වුව ද, අතුරු භෝග වගාව සඳහා දෙනු ලබන සහනාධාරය පසුගිය වර්ෂ කිහිපය තුළදී නොවෙනස්ව පැවතුණි. එහෙයින් වියදම්වල වැඩිවීම නිසා සහනාධාරවල නියම ප්‍රතිඵල විශාල ලෙස පහත වැටී ඇත. පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේ ද පෙන්වා දුන් පරිදි, මෙම සහනාධාර ක්‍රමය වඩා සඵල ව්‍යාප්ති සේවාවන් සමග ඒකාබද්ධ කිරීම ද අවශ්‍ය ය.

පොල් නිෂ්පාදන සඳහා වන අපනයන තීරුබදු ක්‍රමය 1984 නොවැම්බර් මාසයේ දී සංශෝධනය කරන ලදී. පොල් තෙල් සඳහා වන බද්දෙන් නිදහස් අවම අපනයන මිළ මෙට්‍රික් ටොන් එකකට රුපියල් 13,100 සිට රුපියල් 20,000 දක්වා වැඩි කරනු ලැබීය. මෙම බදු නිදහස් අවම මිළ ඉක්මවන මිළ ගණන් සඳහා සියයට 50 ක ඒකීය බදු අනුපාතිකයක් පනවන ලදී. එසේම, කපාපු පොල් අපනයන සඳහා වන අවම තීරු බදු ප්‍රමාණය මෙට්‍රික් ටොන් එකකට රුපියල් 3,500 සිට රුපියල් 5,000 දක්වාද, පොල් ගෙඩි අපනයන සඳහා වන බදු ප්‍රමාණය ගෙඩි 1,000 ක් සඳහා රුපියල් 500 සිට රුපියල් 1,000 දක්වා ද වැඩි කරන ලදී. කොප්පරා අපනයනය සඳහා වන අවම බදු ප්‍රමාණයේ වෙනසක් නොවීය. බදු ක්‍රමයේ ඇතිකළ වෙනස්කම් නිසා නිෂ්පාදකයාට ලැබෙන මිළ ගෙඩි 1,000 කට රුපියල් 2,000 දක්වා, රුපියල් 600 කින් වැඩිවෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

තව දුරටත් පොල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා තියුණු ඉඩම් හිඟයක් පවතින තත්ත්වයක් යටතේ පොල් කර්මාන්තයේ සංවර්ධනය බොහෝ දුරට රඳා පවතින්නේ අළුත් ඉඩම්වල වගා කිරීමට වඩා දැනට වගාව යටතේ පවතින ඉඩම්වල ඵලදායිතාවය වැඩි කිරීම මතය. පොල් නැවත වගා කිරීම පසුගිය වර්ෂ ගණනාවක් තිස්සේ අඩු මට්ටමක පැවති හෙයින් දැනට පවත්නා

පොල් ගස් ප්‍රමාණයෙන් විශාල කොටසක් ඵලදායී වයස් සීමාව ඉක්මවා ගොස් ඇති නිසා, ඒවා වැඩිදියුණු වගා ක්‍රම භාවිතයට සෑහෙන ප්‍රතිචාරයක් නොදක්වයි. මෙයින් පෙනී යන්නේ පැරණි ගස් උදුරා වැඩි පලදාවක් ඇති අළුත් පොල් වර්ග වගා නොකළහොත් ඵලදායීතාවයේ ශීඝ්‍ර වැඩිවීමක් ලබා ගැනීමට අපහසු බවයි.

පොල් කර්මාන්ත අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් මිළ ප්‍රතිපත්තියේ ඇති වැදගත් කාර්‍යභාරය මෑත කාලීන අත්දැකීම් වලින් ද යලි තහවුරු වේ. මිළ ඉහළ යාමට ඉඩ දුන් අවස්ථාවලදී ඔවුන් විසින් වඩා දියුණු වගා ක්‍රම භාවිතය සඳහා, විශේෂයෙන් ම පොහොර භාවිතය සම්බන්ධව, දක්වූ ප්‍රතිචාරය දිරිමත් කරවන අන්දමේ එකක්විය. කෙසේ වුවද, මෙවැනි සතුටුදායක ප්‍රතිචාරයක් දිගු කලක් පවත්වා ගැනීම සඳහා වගා කරුවන්ට වාසි වන පරිදි මිළ වැඩි කිරීමට ඉඳහිට දරනු ලබන ප්‍රයත්නයන් නිසැකයෙන්ම ප්‍රමාණවත් නොවේ. පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේද සඳහන් කළ පරිදි මෙම අංශයේ මිළ ප්‍රතිපත්තිය, වගාකරුවන්ට තමන්ගේ ආයෝජනයන් සඳහා සතුටුදායක ප්‍රතිලාභයක් ලැබිය යුතුය යන මූලික සිද්ධාන්තය මත පදනම් විය යුතු වේ. පාරිභෝගිකයන්ට කෙටි කාලීන වාසි ලබා දීමේ අරමුණින් මෙම සිද්ධාන්තය කැප නොකළ යුතුය. නිෂ්පාදකයන්ට වාසිදායක ප්‍රතිලාභ නොකඩවා ලබා ගැනීමට ඉඩදීම දිගුකාලීන වශයෙන් පාරිභෝගිකයන්ට ද වාසිදායක වනු ඇත.

පොල් තෙල් කර්මාන්තයේ යොදාගන්නා තාක්ෂණය, ඉක්මන් අවධානය යොමු විය යුතු තව අංශයකි. ඉතා පැරණි හා යල් පැනගිය යන්ත්‍ර සූත්‍ර පවත්නා, කුඩා තෙල් මෝල් රාශියකින් සමන්විත පොල් තෙල් කර්මාන්තයට අළුත් තාක්ෂණ ක්‍රමවල නැවත ආයෝජන කිරීමක් අවශ්‍ය වේ. මෙය කපාපු පොල් කර්මාන්තය සඳහා ද අදාළ වේ.

අපනයනය කිරීම සඳහා මෙන්ම දේශීය පරිභෝජනය සඳහා ද අවශ්‍යවන නිෂ්පාදන ප්‍රමාණය වැඩි කරගැනීම සඳහා යොදා ගත හැකි කෙටි කාලීන පියවරක් ලෙස, දැනට පවත්නා ඉතාමත් අකාර්යක්ෂම ක්‍රමයක් වන අතින් පොල් මිරිකා කිරි ලබා ගැනීම වෙනුවට, යන්ත්‍රානුසාරයෙන් පොල් කිරි නිපදවීම යොදා ගත හැකිය. මේ සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම දැනටමත් රට තුළ පවතින බැවින් අවශ්‍යව ඇත්තේ මෙම අංශය වෙත ආයෝජකයන් නැඹුරු කරවීම සඳහා සුදුසු දිරිගැන්වීම් සමූහයකි.

**සුළු අපනයන භෝග**

සුළු අපනයන භෝග නිෂ්පාදනය පිළිබඳ විශ්වාසදායී දත්තයන් නොමැති නිසා, මෙම අංශයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අපනයනය කරන්නේය යන උපකල්පනය මත, අපනයන පරිමාව අනුව සිදු කෙරේ. ඒ අනුව අපනයන පරිමාව කැපී පෙනෙන ලෙස ඉහළයාම මගින් 1984 වර්ෂයේ ගම්මිරිස් සහ කෝපි නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩි වූ බව පෙනේ. 1984 වර්ෂයේ දී ගම්මිරිස් අපනයන පරිමාව දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වූ අතර, කෝපි අපනයන පරිමාව සියයට 18 කින් වැඩි විය. 1984 වර්ෂයේදී කුරුඳු අපනයන පරිමාව සියයට 59 කින් වැඩි වුව ද, මෙය තරමක් දුරට පසුගිය වර්ෂයේදී රැස්කරන ලද තොග අපනයනය සඳහා ප්‍රයෝජනයට ගැනීම නිසා සිදුවන්නට ඇත. 1978 සහ 1981 අතර කාලපරිච්ඡේදය තුළදී ගම්මිරිස් සහ කෝපි, අතුරු භෝග ලෙස වැවීම වඩා වේගවත්ව සිදුවූ නිසා 1984 වර්ෂය වන විට පලදාව ලබන බිම් ප්‍රමාණය වැඩි වන්නට ඇතැයි නිගමනය කළ හැකි අතර, එයින් නිෂ්පාදනය කෙරෙහි සතුටුදායක බලපෑමක් ඇතිවන්නට ඇත. කුරුඳු අපනයනය සැළකිය යුතු ලෙස වැඩිවීම මැක්සිකෝව ශ්‍රී ලංකාවෙන් කරන ආනයන වැඩිවීමේ ප්‍රතිඵලයකි. කෙසේ වුවද නිෂ්පාදනයේ අඩුවීමක් පෙන්නුම් කරමින් කරාබුනැටි අපනයන පරිමාව සියයට 45 කින් අඩු වූ අතර, කරදමුංගු සහ කොකෝවා නිෂ්පාදනයේ අඩුවීමක් පෙන්නුම් කරමින් ඒවායේ අපනයන පරිමාව පිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 27 කින් අඩු විය.

සුළු අපනයන භෝග ආධාර ක්‍රමය යටතේ කොකෝවා, කෝපි, ගම්මිරිස් සහ කරාබුනැටි අළුතින් වගා කළ බිම් ප්‍රමාණයේ කැපී පෙනෙන වැඩි වීමක් 1984 වර්ෂය තුළදී පෙන්නුම් කළේය. පසුගිය වර්ෂය හා සසඳා බලන කල, කොකෝවා වගා කළ බිම් ප්‍රමාණය සිව ගුණයකින්ද, ගම්මිරිස් වගා කළ බිම් ප්‍රමාණය සියයට 56 කින් ද වැඩිවූ අතර, කෝපි සහ කරාබුනැටි වගා කළ බිම් ප්‍රමාණය සියයට 34 බැගින් වැඩි විය. කෙසේ වුවද, සුළු අපනයන භෝග ආධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය මීට වෙනස් ස්වරූපයක් පෙන්නුම් කරමින් කොකෝවා වගා කළ බිම් ප්‍රමාණය සියයට 40 කින් ද, කුරුඳු සහ කරඳමුංගු වගා කළ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 18 කින් සහ සියයට 20 කින් ද අඩු විය.

පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේද සඳහන් කළ පරිදි, පොල් සහ රබර් ඉඩම්වලද, විශේෂයෙන්ම මැදි බිම් ප්‍රදේශවල ආර්ථික වශයෙන් වගාවට නුසුදුසු තේ ඉඩම්වලද සුළු අපනයන භෝග ගණනාවක් ව්‍යාප්ත කිරීම සඳහා බෙහෙවින් ඉඩකඩ ඇත. මෙම අංශය දියුණු කිරීම සම්බන්ධයෙන් රජයේ සහ පෞද්ගලික අංශයේ වතුවලට දැනට වඩා ගතික කාර්ය භාරයක් ඉටු කළ හැකිය. කුරුඳු සම්බන්ධයෙන් වූ සුළු අපනයන බද්දක් හැරුණු විට රජය මෙම භෝග සඳහා අපනයන බදු පනවා නොමැත. මෙම අංශය තවදුරටත් දිරිගැන්වීම සඳහා සුළු අපනයන භෝග ගණනාවක වෙළෙඳාම සම්බන්ධයෙන් තිබූ ව්‍යාපාර පිරිවැටුම් බදු 1984 පෙබරවාරි මාසයේදී ඉවත් කරන ලදී. මෙම භෝග බොහොමයකම නිෂ්පාදන වියදම් ඉතා අඩු මට්ටමක පවතින නිසා නිෂ්පාදකයින් සතුටුදායක ලාභ ආන්තිකයන් ලබන බව පෙනේ. මෙසේ තිබියදීත්, මෙම අංශයේ සමස්ත ක්‍රියාකාරිත්වය බලාපොරොත්තු වූ මට්ටමට ළඟා නොවූ අතර, එය සතුටුදායක වර්ධන මට්ටමක් පවත්වා ගැනීමට ද අපොහොසත් විය. ඒ අනුව මෙම අංශයේ වේගවත් සංවර්ධනය කෙරේ බාධාකාරී වන ව්‍යුහාත්මක සාධක කීපයක් සැපයුම් අංශයෙහි ඇති බව පෙනේ. දැනට ඵල දරණ තත්ත්වයේ තිබෙන ගස්වලින් බොහොමයක් වැඩි පලදාවක් ලැබිය හැකි වර්ගයේ ඒවා නොවීම එවැනි එක් සාධකයක් විය හැකිය. එනිසා අනාගතයේදී වඩාත් සතුටුදායක ප්‍රතිඵල ලබා ගැනීමට නම්, එම අංශයේ නව ආයෝජන සහ ප්‍රතිආයෝජන වේගයෙන් වැඩි කළයුතුව ඇත.

**වී**

1983 වර්ෂයේදී සියයට 15 කින් වාර්තාගත මට්ටමකට වැඩි වූ වී නිෂ්පාදනය, වර්ෂයේ මුල් භාගයේදී පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතු කොටගෙන 1984 දී සුළු වශයෙන් අඩු විය. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 24,20,000 (වී බුසල් 11 කෝටි 60 ලක්ෂයක් හෝ සහල් මෙට්‍රික් ටොන් 16,90,000) වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙය ඉකුත් වසරේ නිෂ්පාදනය හා සසඳන කළ සියයට දෙකක අඩුවීමකි. කෙසේ වුවද, වාර්ෂික දත්තයන්ගෙන් සැබෑ තත්ත්වය එතරම් පිළිබිඹු නොවේ. නිෂ්පාදනයේ මෙම අඩුවීම, සම්පූර්ණයෙන්ම අධික වර්ෂාපතනය හා ගංවතුර හේතු කොට ගෙන 1983/84 මහ කන්නයේ අස්වැන්නේ ඇතිවූ තියුණු අඩුවීමේ ප්‍රතිඵලයකි. නමුත් මෙයට හාත්පසින්ම වෙනස්ව, 1984 යල කන්නයේ නිෂ්පාදනය පෙර වර්ෂයේ යල කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 52 ක වැඩිවීමක් දක්වමින් මෙට්‍රික් ටොන් 10,60,000 ක (වී බුසල් පන් කෝටි අට ලක්ෂයක්) වාර්තාගත මට්ටමකට ළඟාවිය.

1983/84 මහ කන්නයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 13,60,000 ක් (වී බුසල් හය කෝටි 50 ලක්ෂයක්) ලෙස ගණන් බලා ඇත. මෙය ඉකුත් මහ කන්නය හා සසඳන විට මෙට්‍රික් ටොන් 4,26,283 ක (බුසල් දෙ කෝටි හාර ලක්ෂයක්) හෙවත් සියයට 24 ක සැළකිය යුතු අඩුවීමකි. එමෙන්ම, මෙය 1971 න් පසු මහ කන්නයකදී වාර්තාගතවූ අඩුම නිෂ්පාදනයද විය. මහ කන්නයේ අස්වැන්නේ මෙම පහත වැටීම, මුළු වාර්ෂික නිෂ්පාදනයෙහි මහ කන්නයේ සාපේක්ෂ කොටස 1983 දී සියයට 72 සිට 1984 දී සියයට 56 දක්වා කැපී පෙනෙන ලෙස අඩුවීමට හේතු විය.

කෙසේ වුවද, මෙට්‍රික් ටොන් 10,60,000 ක් ලෙස ගණන් බලා ඇති 1984 යල කන්නයේ නිෂ්පාදනය, යල කන්නයක් සඳහා වාර්තාවී ඇති ඉහළම නිෂ්පාදනය වේ. මෙම සැළකිය යුතු වැඩිවීම මගින් මහ කන්නයේ නිෂ්පාදනයේ ඇතිවූ අඩුවීම බොහෝ දුරට සමහන් කරනු ලැබිය. 1984 යල කන්නයේ නිෂ්පාදනය වැඩිවීමට මූලික වශයෙන්ම හේතු වූයේ ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය වැඩිවීමය. ප්‍රධාන සහ සුළු වැව්වල ප්‍රමාණවත් තරම් ජලය තිබීම, වගා කරනු ලැබූ බිම් ප්‍රමාණයේ මෙම වැඩිවීමට හේතුවිය. එසේම මහ කන්නයේ අස්වැන්න බෙහෙවින් අඩු වූ නිසා, යල කන්නයේ දී කුඹුරුවල අනෙකුත් භෝග වලට වඩා වී වගා කිරීමට ගොවීන් වැඩි පෙළඹීමක් දක්වා තිබෙන බවද පෙනෙන්නට ඇත.

**1 . 14 සංඛ්‍යා සටහන**

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1983 - 1984**

| ශීර්ෂය | ඒකකය | 1983 | | | 1984 (අ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| 1. දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 583 | 241 | 824 | 606 | 384 | 990 |
| 2. පොහොර නිකුතුව(ආ) .. | මෙට්‍රික් ටොන් දහස් | 118 | 42 | 160 | 112 | 59 | 171 |
| 3. දෙන ලද ණය ප්‍රමාණය .. | රුපියල් දශ ලක්ෂ | 124 | 29 | 153 | 136 | 40 | 176 |
| 4. අස්වනු කපාගත් දළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 559 | 219 | 778 | 509 | 377 | 886 |
| 5. හෙක්ටයාරයක පලදාව(ඇ) | කිලෝග්‍රෑම් | 3,638 | 3,603 | 3,606 | 3,031 | 3,146 | 3,076 |
| 6. අස්වනු කපාගත් ශුද්ධ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 495 | 194 | 689 | 451 | 336 | 787 |
| 7. නිෂ්පාදනය .. | මෙට්‍රික් ටොන් දහස් | 1,786 | 698 | 2,484 | 1,360 | 1,060 | 2,420 |
| | (බුසල් දහස්) | (85,594) | (33,433) | (119,027) | (65,154) | (50,814) | (115,968) |
| 8. සහතික මිල ක්‍රමය යටතේ මිළදී ගැනීම්(ඈ) .. | මෙට්‍රික් ටොන් දහස් | 313 | 11 | 324 | 115 | 54 | 169 |
| 9. ආනයන (වී සමානය) .. | ,, | — | — | 123 | — | — | 26 |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම සංවර්ධනය හා පර්යේෂණ අමාත්‍යාංශය;
වී අලෙවි මණ්ඩලය;
ලංකා පොහොර සංස්ථාව;
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.

(අ) තාවකාලිකයි.

(ආ) පොහොර නිකුත් කිරීම, වගා වර්ෂය තුළ සහ ලිත් වර්ෂය තුළදී එකිනෙකට වෙනස් වේ. වගා වර්ෂය මහ (සැප්තැම්බර්/ඔක්තෝබර්–මාර්තු/අප්‍රේල්) සහ යල (අප්‍රේල්/මැයි–අගෝස්තු/සැප්තැම්බර්) කන්න වලින් යුක්ත වේ.

(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොට ගත් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව ගණනය කරන ලදී. මුළු වී නිෂ්පාදනය අස්වනු කපාගත් ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය පලදාව ගණනය කරන ලදී.

(ඈ) මහ කන්නයේ අස්වැන්න ජනවාරි - ජූලි කාලච්ඡේදය තුළදී මිළදී ගත් අතර, යල කන්නයේ අස්වැන්න අගෝස්තු - දෙසැම්බර් කාලච්ඡේදය තුළ මිළදී ගන්නා ලදී.

1984 දී හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව කිලෝග්‍රෑම් 3,076 දක්වා සියයට 15 කින් සැළකියයුතු ලෙස අඩුවී ඇති බව ගණන් බලා තිබේ. 1983/84 මහ කන්නයේ සාමාන්‍ය පලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,031 ක් ලෙස ගණන් බලා තිබුණි. මෙය පෙර වර්ෂයේ මහ කන්නය හා සැසඳීමේදී සියයට 17 ක සැළකිය යුතු අඩුවීමකි.

සාමාන්‍ය පලදාවේ මෙම අඩුවීම යල කන්නයේදී ද දක්නට ලැබිණි. කිලෝග්‍රෑම් 3,146 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති 1984 යල කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව 1983 යල කන්නය සඳහා වාර්තා වූ කිලෝග්‍රෑම් 3,603 සමහ සැසඳීමේ දී සියයට 13 (කිලෝග්‍රෑම් 457) ක අඩුවීමකි. සියළුම නිෂ්පාදන කලාපයන් (ප්‍රධාන සහ සුළු වාරිමාර්ග කලාපයන් සහ

වර්ෂාපෝෂිත කලාපය) සාමාන්‍ය පලදාවන්හි අඩුවීම් වාර්තා කරනු ලැබූ අතර, ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශයන්හි සියයට 13 ක වැඩිම පහත වැටීම වාර්තා කරනු ලැබීය. 1984 යල කන්නයේ සාමාන්‍ය පලදාවේ මෙම අසතුටුදායක තත්ත්වය රෝග හා කෘමි උවදුරු වැඩිවීම, සමහර ප්‍රදේශවල ඇති වූ අකල් වැසි, බාල තත්ත්වයේ බීජ වර්ග යොදා ගැනීම, වගාව සඳහා එතරම්ම සුදුසු නොවන ඉඩම් වලටද වගාව ව්‍යාප්ත වීම සහ ඉඩම් ඒකකයකට යොදනු ලැබූ පොහොර ප්‍රමාණය අඩුවීම යන හේතුන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය.

ඉකුත් වසර සමග සසඳනවිට 1984 වසරේ වපුරන ලද මුළු බිම ප්‍රමාණය හෙක්ටයාර 1,65,922 කින් හෝ සියයට 20 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 1984 යල කන්නයේදී වපුරන ලද ඉඩම් ප්‍රමාණය සියයට 59 කින් වැඩිවීමය. මහ කන්නයේ වපුරන ලද ඉඩම් ප්‍රමාණය වැඩිවූයේ සියයට හතරකින් පමණි.

1984 වර්ෂයේදී අස්වනු කපාගත් මුළු බිම් ප්‍රමාණය සියයට 14 කින් වැඩි විය. කෙසේ වුවද, මහ කන්නයේ දී අස්වනු කපාගත් බිම් ප්‍රමාණය සියයට නවයකින් අඩු විය. නමුත් යල කන්නයේදී අස්වනු කපාගත් බිම් ප්‍රමාණය සියයට 72 කින් කැපී පෙනෙන ලෙස වැඩිවීම නිසා මහ කන්නයේදී ඇතිවූ අඩුවීම මුළුමනින්ම සමහන් වූ අතර, වර්ෂය තුළදී අස්වැන්න කපාගත් මුළු බිම් ප්‍රමාණයේ ශුද්ධ වැඩිවීමක් ද ඒ නිසා ඇති විය. යල කන්නයේ ඇතිවූ මෙම වැඩිවීම සාමාන්‍ය පලදාවේ පහත වැටීමෙන් මුළු නිෂ්පාදනයට ඇති වූ අවාසි දායක බලපෑමද සැලකිය යුතු පරිදි අඩු කරනු ලැබිය. 1984 වර්ෂයේදී වපුරන ලද බිම් ප්‍රමාණයත් අස්වැන්න කපාගත් බිම් ප්‍රමාණයත් අතර වෙනස හෙක්ටයාර 1,04,402 ක් හෙවත් වපුරන ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට 11 ක් විය. පෙර වර්ෂයේදී මීට අනුරූප සංඛ්‍යාව හෙක්ටයාර 47,461 ක් හෙවත් එම වර්ෂයේදී වපුරන ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට හයක් විය. කෙසේ වෙතත් 1983/84 මහ කන්නයේදී වගා හානිවූ බිම් ප්‍රමාණය අධික වූ අතර එය වපුරන ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට 16 ක් විය. යල කන්නයේදී එය සියයට දෙකක් පමණක් විය.

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 1984 වගා වර්ෂය තුළදී වී වගා අංශය වෙත නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11,500 කින් හෙවත් සියයට හතකින් වැඩිවිය. කන්නය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන 1983/84 මහ කන්නයේදී නිකුත්කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 6,000 කින් හෙවත් සියයට පහකින් අඩුවිය. මහ කන්නයේදී වපුරන ලද ඉඩම් හෙක්ටයාරයක් සඳහා නිකුත් කළ සාමාන්‍ය පොහොර ප්‍රමාණය සියයට නවයකින් අඩුවිය. 1984 යල කන්නයේදී නිකුත් කළ පොහොර ප්‍රමාණය පෙර වර්ෂයේ යල කන්නයේ දී නිකුත්කළ ප්‍රමාණයට වඩා මෙට්‍රික් ටොන් 17,500 කින් හෙවත් සියයට 42 කින් වැඩි විය. නමුත් පෙර වර්ෂයේ යල කන්නය හා සැසඳීමේදී 1984 යල කන්නයේ වපුරන ලද ඉඩම් හෙක්ටයාරයක් සඳහා නිකුත් කළ සාමාන්‍ය පොහොර ප්‍රමාණය සියයට 11 කින් සැලකියයුතු පරිදි පහත වැටුණි.

1984 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලය මගින් සහතික මිළ ක්‍රමය යටතේ මිළට ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,69,160 (බුසල් 81,06,000 ක්) විය. එය 1983 වර්ෂයේදී මිළට ගත් ප්‍රමාණයට වඩා සියයට 48 කින් අඩු ප්‍රමාණයකි. ඉකුත් වර්ෂයේදී මෙන්ම මිළදී ගැනීම්හි මෙම අඩුවීමට පෞද්ගලික අංශයේ වඩා ප්‍රබල ක්‍රියාකාරිත්වය හේතුවිය. වැඩි ප්‍රමාණයක් මිළදී ගනු ලබන මහ කන්නයේ නිෂ්පාදනයේ ඇතිවූ පහත වැටීමද මෙයට හේතු වූ තවත් කරුණකි. මේ හැරුණ විට වී අලෙවි මණ්ඩලයට රටේ උතුරු ප්‍රදේශයේ ඇතැම් දිස්ත්‍රික්ක වල පැවති නොසන්සුන් තත්ත්වයන් නිසා එහි සාමාන්‍ය මිළදී ගැනීම් කටයුතු කරගෙන යෑමද අපහසුවිය. පෙර වර්ෂවලදී මෙන්ම 1984 වර්ෂයේ මිළදී ගත් ප්‍රමාණයෙන් වැඩි කොටසක් (සියයට 88ක්) මිළදී ගනු ලැබුවේ අතිරික්තයක් පැවති වියලි කලාපීය දිස්ත්‍රික්කයන්ගෙනි. විශේෂයෙන්ම අනුරාධපුරය (මෙට්‍රික් ටොන් 30,801), අම්පාර (මෙට්‍රික් ටොන් 29,783), මඩකලපුව (මෙට්‍රික් ටොන් 25,054) සහ ත්‍රිකුණාමලය (මෙට්‍රික් ටොන් 22,598) යන දිස්ත්‍රික්ක මේ අතර කැපී පෙනේ.

1984 වර්ෂයේදී විවෘත වෙළෙඳ පොළේ වී බුසලක මිළ, වී සඳහා වන සහතික මිළ වූ බුසලකට රු. 62.50 ට (කිලෝවකට රු. 2.99 ක්) වඩා ඉහළින් පැවතුණි. මාසික සාමාන්‍ය විවෘත වෙළෙඳපොල මිළ බුසලකට රු. 78 ක් (කිලෝවකට රු. 3.73 ක්) පමණ වූ නමුත් සාමාන්‍ය විවෘත වෙළෙඳපොල මිළත් සහතික මිළත් අතර පරතරය 1984 මුල් භාගයේ දී බුසලකට රු. 15 ක සිට (කිලෝවකට ශත 72 ක්) වර්ෂයේ දෙවන භාගයේ දී බුසලකට රු. 16.50 ක් (කිලෝවකට ශත 79 ක්) දක්වා වැඩිවිය. වර්ෂය තුළදී විවෘත වෙළෙඳපොලේ වී මිලෙහි මෙම වැඩිවීමේ උපනතිය ප්‍රධාන වශයෙන්ම සැපයුම් තත්ත්වය කෙරෙහි මහ අස්වැන්නේ තියුණු අඩුවීමෙන් ඇතිවූ අවාසිදායක බලපෑම තවදුරටත් පිළිබිඹු කිරීමක් විය. 1984 වර්ෂයේ දී විවෘත වෙළෙඳ-පොල මිළගණන් වැඩි වූවද, නිෂ්පාදන වියදමේ වැඩිවීම නිසා නිෂ්පාදන ආන්තිකයන් අඩුවූ අතර, ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි වියදමේ මෙම වැඩිවීම සියයට 15 ඉක්මවිය. මේ තත්ත්වය යටතේ 1983 මාර්තු මාසයේ සිට බුසලකට රු. 62.50 ක ස්ථාවර මට්ටමක පවතින සහතික මිළ ඉහල දැමීම සළකා බැලිය යුතු කරුණකි.

දැනට වී අලෙවි මණ්ඩලය එහි සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා ආහාර කොමසාරිස්ගේ වැඩකටයුතු මත බෙහෙවින් රඳා පවතී. නමුත් ආහාර කොමසාරිස්ට ආහාර මුද්දර ක්‍රමය නිසා සහල් සඳහා ඇතිවන ඉල්ලුම සපුරාලීම උදෙසා සහල් සැපයීමට නිශ්චිත වගකීමක් ඇති හෙයින්, ඒ සඳහා ස්ථිර තොග පවත්වාගතයුතු බැවින් අස්ථාවර සැපයුම් මාර්ගයක් කෙරෙහි රඳා පැවතීමට නුපුළුවන. මේ අනුව මෙම ආයතන දෙකේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය උදෙසා ඒවායේ කටයුතුවල පූර්ණ සම්බන්ධීකරණයක් අවශ්‍ය බව පෙනේ. වී මිළදී ගැනීමත් සහල් අලෙවියත් අතර එවැනි සම්බන්ධීකරණයක් මෙම කටයුතු එකම ආයතනයක් වෙත පැවරීම මගින් සහතික කරනු ලැබීමට පුළුවන් විය හැක. වී අලෙවි මණ්ඩලය මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රයෝජනයට ගන්නා නිසාත්, එමගින් එහි කටයුතු මුදල් සැපයුම කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබන නිසාත්, මෙම ආයතනයන්ගේ කටයුතු වඩාත් විධිමත් කිරීම මූල්‍ය පාලන පැත්තෙන් බැලීමේදීද සැළකිය යුතු වැදගත්කමක් හිමිකර ගනී.

රට සහලින් ස්වයංපෝෂිත වීමේ තත්ත්වය කරා ගමන් කිරීමේදී ප්‍රතිපත්තිමය අවධානය යොමු විය යුතු තවත් අංශයක් වන්නේ ඉහළ පලදාවක් ලබාගැනීමට නොහැකි වී ඉඩම්වල අනෙකුත් භෝග වගා කිරීම සඳහා ඇති අවශ්‍යතාවයත්, එම ඉඩම් එවැනි භෝග වගාව සඳහා යෙදවිය හැක්කේ කුමන ක්‍රමයන් මගින්ද යන්නත්ය. එසේම ඉකුත් වසරේ වාර්ෂික වාර්තා වෙන්ද පෙන්නුම් කළ පරිදි ආනයනය කරනු ලබන තිරිඟු සඳහා ඇති දැඩි රුචියාව අඩුකිරීමේ අරමුණින් මිළගණන්වල සාපේක්ෂ සුදුසු වෙනස් කිරීම් මගින් සහ සහල් පිළිබඳ වාණිජ නිෂ්-පාදන පුළුල් කිරීම මගින් තිරිඟු පිටි වෙනුවට සහල් පිටි වැඩි වැඩියෙන් ආදේශනය කිරීම දිරිමත් කිරීමද වාසිදායක වනු ඇත.

**අතුරු ආහාර භෝග**

මහ කන්නයතුළදී, ප්‍රධාන වගා ප්‍රදේශ කිහිපයකම පැවති අධික වර්ෂාව සහ ගංවතුර නිසා, පසුගිය වසර කිහිපය තුළදී පවත්වාගත් සතුටුදායක වර්ධන වාර්තාව 1984 වර්ෂය තුළදී එසේ පවත්වා ගැනීමට අතුරු ආහාර භෝග වගා අංශය අපොහොසත් විය. ඉරිඟු, මුංඇට සහ උඳු හැර වෙනත් අතුරු ආහාර භෝග වර්ග කිහිපයක් වගා කළ බිම් ප්‍රමාණය සැළකියයුතු ලෙස පහත වැටුණු බව ලබාගත හැකි තාවකාලික දත්ත අනුව පෙනීයයි. මහ කන්නයේ අස්වැන්න, අධික වර්ෂාව සහ ගංවතුර නිසා පාළුවූ බැවින්, වගා වර්ෂය තුළ නිෂ්පාදනය සැළකිය යුතු ලෙස අඩු විය. මහ කන්නය පාළුවීම යල කන්නයේ වගාව කෙරෙහිද අහිතකර ලෙස බලපෑවේය. යල කන්නයේ වගාව සඳහා අවශ්‍ය බීජ ආදිය කලට වේලාවට නොලැබීමෙන් බොහෝ ගොවීනට තදබල ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදුවිය. යල කන්නයේ වගාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ තවත් හේතුවක් නම්, 1983/84 මහ කන්නයේ වී අස්වැන්න පාළුවීමය. මෙම කරුණත් යල කන්නයේදී වී වගාව සඳහා අවශ්‍ය තරම් ජල පහසුකම් තිබීමත් නිසා, යල කන්නය තුළදී කුඹුරු ඉඩම්වල අතුරු ආහාර භෝග වගා කළ බිම් ප්‍රමාණය අඩුකොට ඒ වෙනුවට වී වගා කිරීමට බොහෝ ගොවීන් පෙළඹී ඇත.

අතුරු ආහාර භෝග වර්ග අටක් සඳහා වී අලෙවි මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ පදනම් මිළ ක්‍රමය මෙම වර්ෂය තුළදිද තවදුරටත් ක්‍රියාත්මක විය. ඉරිඟු, මුං-ඇට සහ උඳු සඳහා ගෙවන පදනම් මිළ 1983/84 මහ කන්නයේ සිට වැඩි කරන ලද අතර, අනෙකුත් මිළ ගණන් ඉකුත් වසරේ මෙන්ම නොවෙනස්ව පැවතිණි. පදනම් මිළ ක්‍රමය යටතේ වී අලෙවි මණ්ඩලය විසින් වර්ෂය තුළදී මිළදී ගත් ඉරිඟු ප්‍රමාණය දෙගුණයකටත් වඩා වැඩිවිය. එසේ වුවද, ඉකුත් වසරේදී සැළකිය යුතු ලෙස වැඩිවූ සෝයා බෝංචි මිළදී ගැනීම් 1983 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 3,749 සිට 1984 දී මෙට්‍රික් ටොන් 200 දක්වා අඩුවිය.

අතුරු ආහාර භෝග වගා අංශයේ ශීඝ්‍ර වර්ධනය කෙරෙහි බලපාන දැඩි බාධක කිහිපයක් ඇති බව පෙනේ. ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ති සේවාවන් නොමැතිකම වැඩි පලදාවක් ලැබෙන බීජ වර්ග අවශ්‍ය තරම් ලබාගත නොහැකි වීම, නිෂ්පාදන ආන්තිකයන් අසතුටුදායක මට්ටමකට පත්කරවන අන්දමේ බෙහෙවින් අපූර්ණ වෙළෙඳපොල ව්‍යුහයක් පැවැතීම සහ ආයතනික ණය පහසුකම් ලබාගැනීමට ඇති අපහසුව වැනි බාධක ඒ අතර වේ. මෙම සාධකයන්ගේ ඒකාබද්ධ බලපෑම වී ඇත්තේ ඒකකයකින් ලැබෙන පලදාව අඩුවීමත්, නිෂ්පාදන ආන්තිකය අඩුවීමත්ය. වඩා ඉහළ පලදාවක් මගින් අතිරේක ආහාර භෝග නිෂ්පාදනය ව්‍යාප්ත කිරීමට බෙහෙවින් ඉඩකඩ තිබුණද, එම ඉඩකඩ ප්‍රයෝජනයට ගතහැකි වන්නේ ඉහතකී බාධකයන් හැකිතරම් හෝ මුළුමනින්ම ඉවත් කිරීමෙන් පමණි. මේ සඳහා අතුරු ආහාර භෝග අංශය වෙනුවෙන් ඒකාබද්ධ සංවර්ධන වැඩපිළිවෙලක් සකස් කිරීම අවශ්‍ය වී ඇත. වී නිෂ්පාදනය සම්බන්ධයෙන් ස්වයංපෝෂිත තත්ත්වයක් කරා රට ගමන් කරමින් සිටින බැවින් වී නිෂ්පාදනය පිළිබඳව දැනට පවතින ප්‍රතිපත්ති සහ සැළසුම් මෙම භෝග සඳහාද ව්‍යාප්ත කිරීම අවශ්‍යය.

**සීනි**

1984 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ සීනි නිෂ්පාදනය (ආහාර කොමසාරිස්ගෙන් මිළට ගත් අපතේ යන සීනි වලින් කළ නිෂ්පාදනය හැර) මෙට්‍රික් ටොන් 18,301 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙය පසුගිය වසරේ නිෂ්පාදනය සමග සසඳන කල සියයට 15 ක අඩු වීමකි. වර්ෂය තුළදී හිඟුරාන සහ කන්තලේ යන කම්හල් දෙකෙහිම නිෂ්පාදන වාර්තාවන් අසතුටුදායක විය. හිඟුරාන කම්හලෙහි නිෂ්පාදනය සියයට 14 කින් අඩු වූ අතර, කන්තලේ කම්හලෙහි නිෂ්පාදනය සියයට 16 කින් අඩුවිය. මෙම අසතුටුදායක තත්ත්වයට හේතුවූයේ උක් වගාවට අවශ්‍ය වාරිමාර්ග ජලය ප්‍රමාණවත්ව නොලැබීමේ හේතුවෙන් සීනි සකස් කිරීමට අවශ්‍ය උක් දඬු සැපයුමේ අඩුවීමයි.

1984 වසරේදී හිඟුරාන කම්හල මගින් පාලනය වන උක් වගාව (වගා කළ බිම් ප්‍රමාණය සහ නිරි වගාව) යටතේ ඇති බිම් ප්‍රමාණය සියයට 16 කින් අඩුවුණි. උක් දඬු කපා ගත් බිම් ප්‍රමාණයේද සියයට 20 ක විශාල අඩු වීමක් වාර්තා විය. සාමාන්‍ය පලදාව වැඩිවූයේ සියයට ඒකක පමණ සුළු ප්‍රමාණයකින් නිසා උක් දඬු කපා ගත් බිම් ප්‍රමාණය අඩු වීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස කපාගත් උක් දඬු ප්‍රමාණය සියයට 19 කින් අඩු විය. කෙසේ වුවද, රජයට අයත් උක් ඉඩම් වල අසතුටුදායක ක්‍රියාකාරිත්වයට වෙනස්ව, පෞද්ගලික අංශයේ වගාකරුවන් විසින් සපයන ලද උක් දඬු ප්‍රමාණය සියයට 28 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 1984 වර්ෂයේදී හිඟුරාන කම්හල මගින් නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනයට ගත් මුළු උක් දඬු ප්‍රමාණයෙන් සියයට 27 ක් පෞද්ගලික අංශය සැපයූ අතර 1983 දී එය සියයට 19 ක් විය.

කම්හල මගින් පාලනය වන බිම් ප්‍රමාණයෙන් ලැබෙන උක් දඬු මත පමණක් රඳා පවතින කන්තලේ කම්හලෙහි ක්‍රියාකාරිත්වය මෙයට වඩා තරමක් දුරට වෙනස්වුණි. කන්තලේ කම්හලෙහි උක් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සියයට 10 කින් ද උක් දඬු කපා ගත් බිම් ප්‍රමාණය සියයට දෙකකින් ද අඩු වීය. සාමාන්‍ය පලදාව සියයට 11 කින් අඩු වූ නිසා කපා ගත් උක් දඬු ප්‍රමාණය සියයට 13 කින් පහළ වැටුණි. පෞද්ගලික අංශය මගින් සැපයෙන උක් දඬු ප්‍රමාණය 1984 වර්ෂයේදී වැඩි වුවද, තවදුරටත් එය ඉතා සුළු ප්‍රමාණයක් විය.

1984 දී කම්හල් දෙකෙහිම සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය තවදුරටත් අඩු වුණි. පසුගිය වසර කීපය තුළදී කන්තලේ කම්හලේ සීනි ලබාගැනීමේ ප්‍රතිශතයට වඩා හිඟුරාන කම්හලේ එම ප්‍රතිශතය අඩු වීමට, ප්‍රදේශය තුළ බලපැවැත්වූ ජලය රඳා පැවතීමේ ප්‍රශ්නය තරමක් දුරට හේතුවිය. ජලය බැස යාමේ විධිමත් ක්‍රමයක් හඳුන්වා නොදුනහොත් හිඟුරාන කම්හලෙහි සීනි ලබාගැනීමේ ප්‍රතිශතය තවදුරටත් අඩු විය හැකිය.

රජය වර්ෂයක් පාසා සීනි ආනයනය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරයි. 1984 වර්ෂයෙහිදී සීනි ආනයනය කිරීම සඳහා රුපියල් 134 කෝටි 60 ලක්ෂයක් වැයවුණි. දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් වන්නේ රටෙහි මුළු අවශ්‍යතාවයන්ගෙන් සියයට 10 ක් පමණ සපුරාලීමට පමණි. වගාව යටතට ගෙන නොමැති සහ උපරිම වශයෙන් ප්‍රයෝජනයට නොගන්නා කෘෂි දේශගුණික වශයෙන් උක් වගාව සඳහා සුදුසු ඉඩම් රටේ සමහර පළාත්වල, විශේෂයෙන්ම වියළි කලාපීය ප්‍රදේශයක් වන මොනරාගල දිස්ත්‍රික්කයේ දක්නට ඇත. එහෙයින් රජය මෙම කර්මාන්තයෙහි ආයෝජන දිරි ගැන්වීම සඳහා දැඩි ප්‍රයත්නයක් දරා ඇති අතර එය ඉදිරියටත් පවත්වාගෙන යනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ ණය පහසුකම් යටතේ ඉදි කළ රජයට අයත් සෙවනගල කම්හලෙහි නිෂ්පාදන කටයුතු 1985 වසරේ දෙවන භාගයේදී ඇරඹෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ වූ පසු හෙක්ටයාර 4,500 ක් පමණ උක් වගාව යටතට ගැනෙන අතර කම්හල වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 27,000 ක් නිෂ්පාදනය කරනු ඇත.

පුද්ගලික අංශයේ ආයෝජන මෙම කර්මාන්තය තුළට ඇද ගැනීම සඳහා රජය විසින් දෙනු ලැබූ සානුබලයන්හි ප්‍රතිඵලයක් ලෙස මොනරාගල දිස්ත්‍රික්කයේ නව සීනි කම්හල් තුනක් ඉදිකිරීමට ජාත්‍යන්තර ආයතන තුනක් එකඟ වී ඇත. මේ අතුරින් සීමාසහිත පැල්වත්ත සීනි සමාගම උක් වගාව සඳහා බිම් සකස් කිරීමේත් කම්හල ඉදි කිරීමේත් කටයුතු සම්බන්ධව සැහෙන ප්‍රගතියක් ලබා ඇත.

සීනි කර්මාන්තයෙහි විදේශීය ආයෝජන මගින් නව තාක්ෂණ දැනුම ලැබෙන හෙයින් මෙම ආයෝජනයන්ගෙන් රටට වාසියක්ද අත් වනු ඇත. කෙසේ වුවද, එවැනි ආයෝජන ඇද ගැනීමට හැකි වනු පිණිස ආනයන මිළ ගණන්වලට වඩා බෙහෙවින් ඉහළින් තිබිය හැකි අන්දමේ කලින් තීරණය කළ මිළ ගණන් සහිත සහතික දේශීය වෙළෙඳපොලක් ඇති කිරීම ප්‍රතිපත්ති සකස් කරන්නන්ගේ සුපරීක්ෂාකාරී අවධානයට යොමු විය යුතු කරුණකි. ඒ සමඟම හිඟුරාන සහ කන්තලේ වැනි රජයට අයත් කම්හල් දෙකෙහි කාර්යක්ෂමතාව සහ නිෂ්පාදන හැකියාව තවදුරටත් නංවාලීම ඉතා ඉක්මණින් කළ යුත්තකි.

**ධීවර හා පශු නිෂ්පාදනය**

පසුගිය වසර කිහිපය තුළ වාසිදායක වර්ධන උපනතියක් පෙන්වූ ධීවර අංශය 1984 දී සැලකියයුතු පසුබෑස්මකට ලක්විය. ඉකුත් වර්ෂය හා සසඳා බලන කල, 1984 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 23 ක පහතවැටීමක් දක්වමින් මෙට්‍රික් ටොන් 1,69,347 ක් වී යැයි ධීවර අමාත්‍යාංශය විසින් තාවකාලිකව ගණන් බලා ඇත. නිෂ්පාදනයේ මෙම පහත වැටීම වෙරළබඩ අංශයේ මෙන්ම මිරිදිය අංශයේ ද දක්නට ලැබුණි. ගැඹුරු මුහුදේ හා වෙරළින් ඈත මුහුදු අංශයේ නිෂ්පාදනයේ සියයට හයක වැඩිවීමක් වාර්තා වුවද නිරපේක්ෂ වශයෙන් ගත්කල වැඩිවීම ඉතාමත් සුළුවූ අතර එය මෙට්‍රික් ටොන් 44 ක් පමණක් විය.

සාමාන්‍යයෙන් මුළු නිෂ්පාදනයෙන් සියයට 80 ක් පමණ වන වෙරළබඩ අංශයේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය බෙහෙවින් බලාපොරොත්තු කඩකරවන සුළුවිය. පසුගිය වර්ෂය හා සසඳා බලන කල මෙම අංශයේ නිෂ්පාදනය සියයට 26 කින් අඩුවිය. එසේ වුවද, මෙම පහත වැටීම ධීවර කටයුතුවලට බාධා ඇතිකල සිවිල් කලබල පැවති උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට මුළුමනින්ම වාගේ සීමාව පැවතිබව මෙහිලා සඳහන් කළ යුතුය. පසුගිය වර්ෂය හා සසඳා බලන කල මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන අංශයේ ද නිෂ්පාදනයේ සියයට 12 ක අඩුවීමක් වාර්තාවී ඇත.

මුහුදු ධීවර අංශය නවීකරණය කිරීමේ වැඩ පිළිවෙල යටතේ 1984 වර්ෂයේ දී ගෙවන ලද මුළු සහනාධාරය රුපියල් එක් කෝටි 40 ලක්ෂයක් විය. මිරිදිය මත්ස්‍ය අංශය සඳහා ධීවර යාත්‍රා සහ පොකුණු සහනාධාරය වශයෙන් පිළිවෙලින් රුපියල් 20 ලක්ෂයක් හා රුපියල් 16 ලක්ෂයක් ප්‍රදානය කරනලදී. 1984 දී මාදැල් ධීවරයින්ගේ යහපත සඳහා ලංකා බැංකුව විසින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනලදී. මෙම ණය ක්‍රමය යටතේ ධීවරයෙකුට මාදැල් යාත්‍රා හා ධීවර ආම්පන්න මිළදී ගැනීම සඳහා රුපියල් ලක්ෂයක උපරිම ණය මුදලක් සපනුය ලබන අතර යාත්‍රා හා ධීවර ආම්පන්න අලුත්වැඩියා හා ප්‍රතිසම්පාදනය සඳහා රුපියල් 50,000 ක උපරිම මුදලක් සපයනු ලැබේ.

1984 වර්ෂය තුළදී ධීවර සංවර්ධන යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. වයඹ වෙරළබඩ ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය, නැගෙනහිර වෙරළබඩ ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය, බටහිර වෙරළබඩ ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය සහ කිරින්ද ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය ද මේ අතරට ඇතුළත් විය. මෙම සංවර්ධන වැඩ කටයුතු වලින් වැඩි කොටසකට මුදල් ලැබෙනුයේ විදේශ මූලාශ්‍රයන්ගෙනි. වර්ෂය තුළදී විදේශ ආයෝජන උපදේශක කමිටුව සහ දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් ධීවර සංවර්ධන යෝජනා ක්‍රම හතරක් අනුමත කරන ලද අතර ඒවා වැඩි වශයෙන්ම ඉස්සන් ඇල්ලීම සම්බන්ධ ඒවාය.

1979-1983 කාලය තුළ ධීවර අංශය සඳහා පස් අවුරුදු සංවර්ධන සැලසුමක් ද ක්‍රියාත්මක කරන ලදි. මෙබඳු ප්‍රයත්නයන් පැවතුනද, මෙම අංශයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය බලාපොරොත්තු වූවාට වඩා පහත වැටිණි. පසුගිය වසර කිහිපය ඇතුළත මාළු වල පාරිභෝගික මිළ ගණන් නොකඩවා වැඩිවිය. වැඩිවන ඉල්ලුමත් සමග සැපයුම ප්‍රමාණවත්නොවීම මෙම උපනතියට හේතු වූ බව පෙනේ. කෙසේ වුවද, මෙම පාරිභෝගික මිළ වැඩිවීමේ උපනතියෙහි වාසි ධීවරයන් වෙත ලැබුණේද යන්න සැක සහිතය. ලබාගත හැකි තොරතුරු වලට අනුව ධීවර කර්මාන්තයේ නියුතු පුද්ගලයින් බොහෝ දෙනෙක් බෙහෙවින් ම දිළිඳු තත්ත්වයේ පසුවන බව පෙනියයි. මේ අනුව සාමාන්‍යයෙන් සලකා බලන කල, නිෂ්පාදකයින්ට හෝ පාරිභෝගිකයින්ට මෙම අංශයේ කරන ලද ආයෝජන වල ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වූ බව පෙනේ. ආයතනික ව්‍යුහයේ පූර්ණ ප්‍රතිසංවිධානයක් ද සහනාධාර ඇතුළු සානුබලයන් සහ ආයෝජන වැඩපිළිවෙලවල් නැවත සකස් කිරීමක් ද අවශ්‍ය බැව් පෙනියයි. අනාගතයේදී වඩා යහපත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා මෙම අංශයෙහි, රාජ්‍ය අංශය මගින් පසුගිය කාලයේ කරනලද ආයෝජනයන් පිළිබඳව සම්පූර්ණ අගැයීමක් කිරීම හදිසි අවශ්‍යතාවයක් බව පෙනියයි.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් 1984 වර්ෂයේදී කිරි නිෂ්පාදනය (මීකිරි ඇතුළුව) ලීටර් 32 කෝටි 70 ලක්ෂයක් බව තාවකාලිකව ගණන් බලා ඇත. මෙය 1983 නිෂ්පාදනයට වඩා සියයට තුනක වැඩිවීමකි. ගව ආහාරවල මිළ ඉහළ යාමේ හේතුවෙන් අහිතකර ලෙස නිෂ්පාදන ආන්තිකයන් අඩුවීම වැළැක්වීම සඳහා 1984 සැප්තැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි කිරිවල නිෂ්පාදන මිළ ජාතික කිරි මණ්ඩලය විසින් ලීටරයකට ශත 50 බැගින් වැඩිකරන ලදි. 1984 වර්ෂයේදී ජාතික කිරි මණ්ඩලය මගින් එකතුකරන ලද කිරි ප්‍රමාණය කිරි ලීටර් පන් කෝටි 70 ලක්ෂයක් වූ අතර එය පසුගිය වර්ෂයේ එකතු කරනලද ප්‍රමාණයට වඩා සියයට දෙකක වැඩි වීමකි.

විශේෂ සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් සත්ව නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම සඳහා රජය විසින් දරන ලද ප්‍රයත්නයන් 1984 වර්ෂයේ දී ද නොකඩවා කරගෙන යන ලදී. මෙම විශේෂ යෝජනා ක්‍රම අතරට අනුරාධපුර දිස්ත්‍රික්කයේ වියලි කලාපීය කෘෂිකාර්මික ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා-බටහිර ජර්මන් එළු සංවර්ධන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා-ස්විට්සර්ලන්ත සත්ව නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා-ආසියානු බැංකු සත්ව නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘතියද ඇතුළත් වේ.

1984 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය 56 කෝටි 10 ලක්ෂයක් ලෙස ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් තාවකාලිකව ගණන් බලා ඇති අතර, මෙය ඉකුත් වසර හා සසඳා බලන කල සියයට එකක සුළු පහත වැටීමක් පෙන්නුම් කරයි.

## ග්‍රාමීය ණය

ග්‍රාමීය අංශය සඳහා ආයතන ගණනාවක් විසින් ණය සපයනු ලැබේ. ලංකා බැංකුව, මහජන බැංකුව, සමුපකාර ග්‍රාමීය බැංකු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, ඉන්දියන් ඕවර්සීස් බැංකුව සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව මීට ඇතුළත් වේ. රාජ්‍ය අංශයේ වාණිජ බැංකු දෙක විසින් පසුගිය කාලයේදී මෙන්ම තවදුරටත් ග්‍රාමීය ණය සැපයීම පිළිබඳ වැදගත්ම කාර්ය භාරය ඉටු කරනු ලැබිය. ආයතන ගණනාවක්ම මෙම ක්ෂේත්‍රයෙහි විවිධාකාරයෙන් සම්බන්ධ වී සිටින නමුත්, මෙහිදී ප්‍රධාන වශයෙන්ම විස්තර කෙරෙනුයේ මහ බැංකුව මගින් නොකඩවා ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලබන සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මහජන බැංකුව, සමුපකාර ග්‍රාමීය බැංකු, ලංකා බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව විසින් දෙන ලද ණය සම්බන්ධවය.

1984 වගා වර්ෂය තුළදී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ඊට සහභාගි වන සියළුම බැංකු විසින් දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 21 කෝටි 70 ලක්ෂයක් වූ අතර, එය ඉකුත් වගා වර්ෂය තුළදී දුන් ණය ප්‍රමාණය වූ රුපියල් 18 කෝටි 10 ලක්ෂයකට වඩා සියයට 20 ක වැඩි වීමක් පෙන්වීය. දෙන ලද මුළු ණය ප්‍රමාණයෙහි මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ, මහජන බැංකුව විසින් සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දුන් ණය ප්‍රමාණය සියයට 30 කින් (රුපියල් දෙකෝටි 22 ලක්ෂයකින්) වැඩි වීමය. ඉකුත් වසරේ සම කාලච්ඡේදය සමඟ සසඳන කළ ලංකා බැංකුව දුන් ණය ප්‍රමාණය සියයට නවය කින්ද (රුපියල් 62 ලක්ෂයකින්), හැටන් නැෂනල් බැංකුව දුන් ණය ප්‍රමාණය සියයට 21 කින් (රුපියල් 75 ලක්ෂයකින්) ද වැඩි විය. දුන් ණය ප්‍රමාණයෙහි විශාල වැඩි වීමක් වාර්තා කළ මහජන බැංකුව විසින්, සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණයෙහි සිය සාපේක්ෂ කොටස 1983 දී සියයට 41 සිට 1984 දී සියයට 45 දක්වා වැඩි කරගනු ලැබීය. එසේ වුවද, ලංකා බැංකුවේ සාපේක්ෂ කොටස 1983 දී සියයට 39 සිට 1984 දී සියයට 35 දක්වා අඩු වූ අතර, හැටන් නැෂනල් බැංකුව සිය සාපේක්ෂ තත්ත්වය ඒ පරිදිම පවත්වා ගැනීමට සමත් විය.

1984 වගා වර්ෂය තුළදී වී වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 17 කෝටි 63 ලක්ෂයක් විය. මෙය ඉකුත් වගා වර්ෂය තුළදී දෙන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 15 කින් වැඩි ප්‍රමාණයක් වූ අතර, වර්ෂය තුළදී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 81 ක් විය. ඉකුත් වසරේ මීට අනුරූප වී වගා ණයෙහි සාපේක්ෂ කොටස සියයට 84 ක් විය. 1984 වර්ෂයේදී මහජන බැංකුව විසින් දෙන ලද වී වගා ණය ප්‍රමාණය රුපියල් එක් කෝටි 62 ලක්ෂයකින් වැඩි වූ අතර, එය වර්ෂය තුළදී වී වගාව සඳහා දුන් ණය ප්‍රමාණයෙහි වූ මුළු වැඩි වීම වන රුපියල් දෙකෝටි 36 ලක්ෂයෙන් සියයට 69 ක් විය. සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද මුළු වී වගා ණය ප්‍රමාණයෙහි මහජන බැංකුවේ සාපේක්ෂ කොටස 1983 දී සියයට 44 සිට 1984 දී සියයට 48 දක්වා ඉහළ නැගුණි. සාපේක්ෂ මෙන්ම නිරපේක්ෂ වශයෙන්ද ලංකා බැංකුව වාර්තා කළ වැඩිවීම ඉතා සුළු විය.

1984 වගා වර්ෂය තුළදී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ වී වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් මහ කන්නය සඳහා දෙන ලද වී වගා ණය ප්‍රමාණය රුපියල් 13 කෝටි 61 ලක්ෂයක් නැතහොත් සියයට 77 ක් විය. ඉකුත් වසරේ මෙම අනුරූප කොටස සියයට 81 ක් විය. මහ කන්නයේ වී වගාව සඳහා මහජන බැංකුව රුපියල් හයකෝටි 62 ලක්ෂයක ණය දී ඇති අතර, ඉකුත් වසරේ එම කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණය සමඟ සසඳන කල එය සියයට 30 ක වැඩිවීමක් විය. මෙයට වෙනස්ව, ලංකා බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව දුන් ණය ප්‍රමාණයන්හි පිළිවෙලින් සියයට හතරක සහ සියයට පහක පහත වැටීමක් දක්නට ලැබුණි.

## 1 . 15 සංඛ්‍යා සටහන

### සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද වගා ණය
### (1984 දෙසැම්බර් 31 වැනි දිනට තත්ත්වය)

රුපියල් දශ ලක්ෂ

| කන්නය/වර්ෂය | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව | | | මුළු ණය ප්‍රමාණය | | සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දුන් මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර භෝග | මුළු ණය ප්‍රමාණය | වී | අතුරු ආහාර භෝග | මුළු ණය ප්‍රමාණය | වී | අතුරු ආහාර භෝග | මුළු ණය ප්‍රමාණය | වී | අතුරු ආහාර භෝග | |
| 1982/83 මහ .. | 50·8 | 3·7 | 54·5 | 45·1 | 9·7 | 54·8 | 28·3 | 4·0 | 32·3 | 124·2 | 17·4 | 141·6 |
| 1983 යල .. | 17·0 | 3·0 | 20·0 | 9·5 | 6·1 | 15·6 | 2·1 | 1·7 | 3·8 | 28·6 | 10·8 | 39·4 |
| 1983 වගා වර්ෂය .. | 67·8 | 6·7 | 74·5 | 54·6 | 15·8 | 70·4 | 30·4 | 5·7 | 36·1 | 152·8 | 28·2 | 181·0 |
| 1983/84 මහ .. | 66·2 | 9·1 | 75·3 | 43·1 | 11·7 | 54·8 | 26·8 | 5·5 | 32·3 | 136·1 | 26·3 | 162·4 |
| 1984 යල .. | 17·8 | 3·6 | 21·4 | 14·3 | 7·5 | 21·8 | 8·1 | 3·3 | 11·4 | 40·2 | 14·4 | 54·6 |
| 1984 වගා වර්ෂය(අ).. | 84·0 | 12·7 | 96·7 | 57·4 | 19·2 | 76·6 | 34·9 | 8·8 | 43·7 | 176·3 | 40·7 | 217·0 |

(අ) තාවකාලිකයි.

මූලයන් : මහජන බැංකුව;
ලංකා බැංකුව;
සීමාසහිත හැටන් නැෂනල් බැංකුව.

1984 යල කන්නයේදී වී වගාව සඳහා සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ රුපියල් හාර කෝටි දෙලක්ෂයක ණය දී ඇත. මෙය ඉකුත් යල කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 41 ක වැඩිවීමකි. මෙයට හේතුව වූයේ ලංකා බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව විසින් වාර්තා කර ඇති සැළකිය යුතු වැඩිවීමයි. යල කන්නයේ වී වගාව සඳහා මහජන බැංකුව විසින් දෙන ලද ණය ප්‍රමාණය ඉකුත් යල කන්නයේ දුන් ප්‍රමාණයට බොහෝදුරට සමාන විය.

1984 වගා වර්ෂය තුළදී අතුරු ආහාර භෝග වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් හාර කෝටි හත් ලක්ෂය දක්වා ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 43 කින් වැඩිවිය. මෙම වැඩිවීමෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයකට මහජන බැංකුව දායක වූ අතර, අතුරු ආහාර භෝග වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණයෙහි මහජන බැංකුවේ සාපේක්ෂ කොටස 1983 දී සියයට 24 සිට 1984 දී සියයට 31 දක්වා වැඩිවිය.

සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද වගා ණය ආපසු අයකර ගැනීම 1984 වර්ෂය තුළදී පිරිහීමක් පෙන්විය. 1983/84 මහ කන්නය සඳහා දෙන ලද මුළු වී වගා ණය ප්‍රමාණයෙන් 1984 වර්ෂය අවසානය වන විට ආපසු අයකර ගෙන තිබුණේ සියයට 64 ක් පමණි. එහෙත් 1982/83 මහ කන්නයේ වී වගා ණය ප්‍රමාණයෙන් සියයට 73 ක් 1983 වර්ෂය අවසානය වනවිට අය කරගෙන තිබිණි. මෙම ආපසු අය කර ගැනීමේ දුර්වලතාවය සහභාගී වන සියළුම බැංකු සම්බන්ධයෙන් දක්නට ලැබිණි. මහ කන්නයේ වී වගා ණය ආපසු අයකර ගැනීමෙහිදී දක්නට ලැබුණු මෙම සාපේක්ෂ දුර්වල ක්‍රියාකාරිත්වයට බොහෝදුරට හේතු වූයේ වගා ප්‍රදේශ බොහොමයකම ගංවතුර සහ අධික වර්ෂාව නිසා වගා පාළුවීමය.

1977 ජනවාරි 1 වැනි දින සිට 1981 ජූනි 30 දක්වා දෙන ලද වගා ණය බේරීමේ කාලය නැවත දීර්ඝ කිරීම පිළිබඳ ක්‍රමයේ ප්‍රගතිය 1984 වර්ෂයේදී තවදුරටත් දුර්වල තත්ත්වයක පැවතිණි. 1984 වර්ෂය තුළදී වුවමනාවෙන් ණය පැහැර හැරි පුද්ගලයන් විශාල සංඛ්‍යාවකට විරුද්ධව ලංකා බැංකුව විසින් නීති මගින් කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළදී එකී ණය පැහැර හැරි පුද්ගලයන්ගෙන් රුපියල් 30 ලක්ෂයක් අයකර ගැනීමට බැංකුවට හැකිවිය.

ග්‍රාමීය ණය ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩලය වන ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය වර්ෂය තුළදී රැස්වීම් වාර කිහිපයක්ම පැවැත්විය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම සඳහා වූ ව්‍යවස්ථා කෙටුම්පත් සම්පාදනය වර්ෂය තුළදී අවසන් කරන ලදී. මහ බැංකුවේ මාතර සහ අනුරාධපුර ශාඛාවන් විසින් ග්‍රාමීය සංවර්ධන කටයුතු නඟා සිටුවීම පිණිස විශේෂ ග්‍රාමීය ණය සැපයීමේ වැඩපිළිවෙලවල් නොකඩවා කරගෙන යනු ලැබීය.[1]

## කර්මාන්ත[2]

පසුගිය පස්වසර හා සැසඳීමේ දී 1984 වර්ෂයේ දී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය සමස්ත වශයෙන් සැළකියයුතු දියුණුවක් පෙන්නුම් කළේය. ඉහළ වර්ධන අනුපාතිකය, සීඝ්‍ර ලෙසින් අපනයන කටයුතු ප්‍රසාරණයවීම, ඇහලුම් කර්මාන්ත අංශයේ ආයෝජනය සඳහා අවධාරණය අළුත්වීම සහ ආයෝජකයන්ගේ විශ්වාසය යළිත් පණගැන්වීම තුළින් එය පිළිබිඹු විය. පසුගිය දශකය තුළ ඉහළම වර්ධන අනුපාතයක් වාර්තා කරමින් කර්මාන්ත අංශයේ නිමැවුම මූර්ත වශයෙන් සියයට 15 කින් වැඩිවීයයි ඇස්තමේන්තු කර ඇත. වර්ෂය තුළදී

---

1. මහ බැංකුවේ ග්‍රාමීය ණය කටයුතු පිළිබඳවද මහ බැංකුවේ මාතර සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල දෙකෙහි කටයුතු පිළිබඳවද වැඩි විස්තර මෙම වාර්තාවේ XX – XXIV, XXIV – XXVII වැනි පිටුවල දක්වා ඇත.

2. පසුගිය වර්ෂවලදී මෙන්ම 1984 වර්ෂයේදීද කර්මාන්ත අංශයේ ප්‍රගතිය පිළිබඳ දත්තයන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ලොකු, මධ්‍යම සහ කුඩා සියළුම වාර්තාගත සහ ප්‍රසිද්ධ නිමැවුම් කර්මාන්තයන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් යවන ලද ප්‍රශ්නාවලියකට ලැබුණු පිළිතුරු මත පදනම් වී ඇත. (කෙසේ වුවද, ජාතික ආදායම ගණනය කිරීමේදී, කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස වර්ග කරනු ලබන වැවිලි කර්මාන්තයට සම්බන්ධ අපනයන සැකසුම් කටයුතු මීට ඇතුළත් කර නැත.) පොදුවේ ගත් කල, ආමන්ත්‍රිත ආයතනයන්ගෙන් තුනෙන් පංගුවකින් පමණ පිළිතුරු ලැබුණ අතර ඒවායින් ප්‍රධාන කර්මාන්ත සියල්ලම පාහේ නියෝජනය විය. දත්තයන් ලබාගත නොහැකි වූ අංශයන් පිළිබඳව, විවිධ රාජ්‍ය ආයතනයන් හා සංවිධානයන්ගෙන් ලබාගත හැකි වූ තොරතුරු පදනම්කොට කැරුණු ඇස්තමේන්තු ප්‍රයෝජනයට ගනු ලැබිණ.